ක්ෂණික යොමුව

ලියාපදිංචි කාර්යාලය

94,කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.
www.nilis.cmb.ac.lk

දුරකථන අංක

පොදු	: +94-11-250 7150
අධ්‍යක්ෂ	: +94-11-250 7148
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි	: +94-11-255 9646
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි	: +94-11-250 7952
ෆැක්ස් අංක	: +94-11-2559285
විද්‍යුත් තැපෑල	: director@nilis.cmb.ac.lk

NILIS

දැක්ම

“පුස්තකාල හා තොරතුරු විද්‍යා කේන්ද්‍රයේ
විශිෂ්ට මධ්‍යස්ථායනක් වීම”

මෙහෙවර

“ජාතික හා දකුණු ආසියානු සන්දර්භය තුළ

පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනය පුහුණුව සහ පර්යේෂණ

සඳහා ප්‍රමුඛ ආයතනයක් වීම ”

අධ්‍යක්ෂකගේ පණිවිඩය



2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ (NILIS) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන සතුටු වෙමි.
ශ්‍රී ලංකාවට දැනුම පාදක ගෝලීය ආර්ථිකයක් අත්පත්කර ගැනීම සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය පුස්තකාල හා තොරතුරු විද්‍යා, තොරතුරු කළමනාකරණ සහ ගුරු/පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ක්ෂේත්‍රවල අධ්‍යාපනික සහ පුහුණු පාඨමාලා සපයන අතර ශ්‍රී ලංකාව තොරතුරු සාක්ෂරතාව සහිත රටක් බවට පත් කිරීමේ ජාතික වගකීමද එය සතු වේ. එහෙයින් NILIS සියලු වර්ගයේ පුස්තකාලවලට (රජයේ,මහජන,පාසල්,විශේෂ සහ විශ්වවිද්‍යාල) පාඨමාලා සපයනු ලබයි.
කොවිඩ් 19 වසංගතය, අඛණ්ඩ ඉන්ධන සහ විදුලිබල අර්බුදය හේතුකොට ගෙන බොහෝ අනෙකුත් අධ්‍යාපනික ආයතනවලට මෙන්ම NILIS වෙතද 2022 මිශ්‍ර ප්‍රතිඵල ගෙන දුන් වසරක් විය. මෙය දේශන පැවැත්වීමට මෙන්ම සිසුන් බඳවා ගැනීමට ද අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වෙතත් මාර්ගගත මාදිලියෙන් බොහෝ අධ්‍යාපනික වැඩසටහන් සහ විභාග පැවැත්වීමට NILIS වෙත හැකියාව ලැබිණි. එමෙන්ම ප්‍රමාද වූ ප්‍රතිඵල ද ආවරණය වන පරිදි විභාග 29ක ප්‍රතිඵල නිකුත් කිරීමට ද NILIS සමත් විය.
NILIS 2022 අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය මාර්ගගත ආකාරයට පැවැත්වීම මෙම වසරේ ලැබූ තවත් ජයග්‍රහණයකි. එය කැළණිය විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන අධ්‍යනාංශය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා ගුරුවරුන්ගේ ඉන්දියානු සංගමය (IATUS) සමඟ හවුල්කාරිත්වයෙන් සංවිධානය කෙරිණි. මෙයට බංගලාදේශය, ඉන්දියාව, ජපානය, දකුණු අප්‍රිකාව, තායිලන්තය, තායිවානය, එක්සත් ජනපදය සහ රුසියාව යන රටවලින් ඉදිරිපත් කළ ජාත්‍යන්තර පර්යේෂණ පත්‍රිකා නවයක් ද ඇතුළුව පර්යේෂණ පත්‍රිකා 27ක් ඉදිරිපත් කෙරිණි. ආරාධිත පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමෙන් පසු විද්වත් මණ්ඩලය සාකච්ඡාවක් පවත්වන ලද අතර ගෝලීය සන්දර්භයක් තුළ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ කැපී පෙනෙන කරුණු රැසක් වෙත ආලෝකයක් සැපයීමට ඊට හැකියාව ලැබිණි. කෙසේ වෙතත්, මෙම වර්ෂයේ සැළකිය යුතු අඩුපාඩුද පැවතිණි. විවිධ වේලාවන්හිදී සිදු කරන ලද දීපව්‍යාප්ත බලශක්ති කප්පාදුව හේතුවෙන් සැළසුම් කර තිබූ කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. අධ්‍යාපන අමාත්‍යාංශය මුහුණ දුන් මූල්‍ය ගැටලු නිසා 2022 වර්ෂයේ දී ගුරු පුස්තකාලයාධිපති පශ්චාත් උපාධිය සඳහා ඔවුන් කිසිදු සිසුවෙකු නම් නොකරන ලදී. වෙබ් නිර්මාණ ශිල්පියෙකු නොමැති වීමද 2022 වසරේ දී අත්දකින ලද ප්‍රධාන අඩුපාඩුවකි. 2023 වසරේ දී මෙම තත්ත්වය සමනය වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.
විශ්වවිද්‍යාල අත්පොත මත පදනම්ව NILIS විභාග අත්පොත සැකසීම, සියලු සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා, සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම විස්තර පත්‍රිකා සහ අයදුම්පත් සැකසීම සහ ඩිප්ලෝමා පාඨමාලා සඳහා අතුරු නීති සම්පාදනය වැනි ගුණාත්මක වර්ධනය සඳහා වන මූලපිරීම සම්පූර්ණ කිරීමට හැකි විය. එමෙන්ම අධ්‍යාපනික පාඨමාලා කීපයක විෂයමාලා ප්‍රතිශෝධනය ආරම්භ කිරීමට 2022 වසරේදී හැකියාව ලැබිණි. මෙම සියලු මූලපිරීම් NILIS අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවයට ධනාත්මක දායකත්වයක් සපයනු ඇත.
මෙම අභියෝගාත්මක වසර තුළ සපයන ලද අතිමහත් සහාය වෙනුවෙන් සියලුම අධ්‍යයන කාර්යමණ්ඩලවල සාමාජිකයන්ටත් බාහිර කථිකාචාර්ය මණ්ඩලයටත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ජානක විපුලරත්න සහ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී චරිත බණ්ඩාර යන මහත්වරුන් විසින් මෙහෙයවන ලද පරිපාලන සහ මූල්‍ය අංශවල කාර්යමණ්ඩලයටත් ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම මෙම කාලපරිච්ඡේදය තුළ සපයන ලද සහයෝගය සහ කැපවීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයටත් අධ්‍යයන කමිටුවටත් මූල්‍ය කමිටුවටත් අනෙකුත් ව්‍යවස්ථාපිත කමිටුවලටත් උපකුලපතිතුමාටත් මණ්ඩපාධිපතිතුමාටත් සියලුම පීඨාධිපතිවරුන්ටත් මාගේ හෘදයාංගම කෘතඥතාව පුද කරමි. තවද, අප වෙත අඛණ්ඩව විශ්වාසය තැබූ සහ පක්ෂපාතීත්වය පළ කළ සියලුම සිසුන්ට ද ස්තුතිය පළ කරමි.

ආචාර්ය ප්‍රදීපා විජේතුංග
අධ්‍යක්ෂ/ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

පටුන

01. කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (නිලීස්) පිළිබඳ හැඳින්වීම **5**
01.1 ඉතිහාසය 5
01.2 ක්‍රියාකාරීත්වයේ විෂය පථය 5
01.3 සංවිධාන ව්‍යුහය 5
01.3.1 නිලීස් කළමනාකරණ මණ්ඩලය: 7
01.3.2 නිලීස් අධ්‍යයන කමිටුව: 8
01.3.3 විගණන කමිටුව: 8
01.3.4 මූල්‍ය කමිටුව: 9
01.3.5 රැස්වීම්වල ව්‍යවස්ථාපිත අවශ්‍යතා 9
01.3.6 කාර්ය මණ්ඩලය 10
01.3.7 බාහිර කථිකාචාර්ය මණ්ඩලය 10
02. 2022 තුළ පවත්වන ලද පාඨමාලා පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් **11**
02.1 2018-2022 කාලය තුළ බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 12
02.2 පාඨමාලාවල ප්‍රගතිය (2018-2022) 12
02.2.1 පශ්චාත් උපාධි පාඨමාලා 12
02.2.2 ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලා 13
02.2.3 සහතික/උසස් සහතික පාඨමාලා 14
02.2.3 2022 තුළ NILIS විසින් පවත්වනු ලබන පාඨමාලා වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ව්‍යාප්තිය .. 14
02.2.4 කෙටි කාලීන පාඨමාලා/ වැඩමුළු/ වෙබ් සම්මන්ත්‍රණ 15
02.3 පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවය 16
02.4 ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය 16
02.5 නිලීස් පර්යේෂණ සම්මන්ත්‍රණය 2022 17
03. පර්යේෂණ සහ සංවර්ධනය සඳහා නිලීස් හි දායකත්වය **23**
03.1 පර්යේෂණ සහ සංවර්ධනය සඳහා නිලීස් හි දායකත්වය 23
03.1.1 පර්යේෂණ ආධාර 23
03.1.2 බාහිර ආයතනවල කටයුතු සඳහා නිලීස් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය 23
03.1.3 පර්යේෂණ සඳහා NILIS අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය 24
03.2 නිලීස් පශ්චාත් උපාධි සිසුන් විසින් සිදු කරනු ලබන පර්යේෂණ 27
03.2.1 MPhil/PhD සිසුන්ගේ පර්යේෂණ මාතෘකා 27
03.2.2 නිබන්ධන මාතෘකා, සුපරීක්ෂකවරුන් (PGDip (LIS)/ MLS - 2020/2022) 28
04. මූල්‍ය තත්වය **29**
04.1 පුනරාවර්තන වියදම් 29
04.2 ප්‍රාග්ධන වියදම් 30
05. උපායමාර්ගික සැලැස්මේ තිරසාර සංවර්ධන ඉලක්ක **31**
06.මූල්‍ය ප්‍රකාශනය **2022** **37**
07.විගණකාධිපති වාර්තාව **57**
08.විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු **65**

01. කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (නිලීස්) පිළිබඳ හැඳින්වීම

01.1 ඉතිහාසය

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (නිලීස්), කොළඹ විශ්වවිද්‍යාලය 1999 දී කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 සහ 24 වගන්ති යටතේ ආඥාපනතකින් පිහිටුවන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සපයන ලද්දේ ලෝක බැංකුවේ අරමුදල් යටතේ ක්‍රියාත්මක සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය (GEP 2) යටතේය.

01.2 ක්‍රියාකාරීත්වයේ විෂය පථය

ශ්‍රී ලංකාවට දැනුම පදනම් කරගත් ගෝලීය ආර්ථිකයක් සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි පුස්තකාල හා තොරතුරු විද්‍යා, තොරතුරු කළමනාකරණය සහ ගුරු/පාසල් පුස්තකාල යන ක්ෂේත්‍රවල අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ආයතනය මඟින් සපයයි. ශ්‍රී ලංකාව තොරතුරු සාක්ෂරතා රාජ්‍යයක් බවට පත්කිරීමේ ජාතික වගකීම නිලීස් සතු වේ. මේ අනුව, පුස්තකාල සහ තොරතුරු වෘත්තිකයන්ගේ සියලුම අංශ සඳහා නිලීස් පාඨමාලා සපයයි.
පුස්තකාලය සහ තොරතුරු විද්‍යාව, තොරතුරු සාක්ෂරතාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ඩිජිටල් සාක්ෂරතාවය සහ තොරතුරු යන ක්ෂේත්‍රවල පුස්තකාල කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සඳහා එය අධ්‍යාපන වැඩසටහන්, කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු කිහිපයක් නිතිපතා පවත්වයි.
2005 දී, නිලීස් විසින් 'සවිබලකරණය 8' නම් වූ තොරතුරු සාක්ෂරතා ක්‍රියාත්මක කිරීමේ ආකෘතියේ වෙළඳ ලකුණ ලියාපදිංචි කරන ලදී, එය තවමත් කලාපය පුරා තොරතුරු සාක්ෂරතා උපදෙස් සඳහා භාවිතා වේ. ජාතික සහ පළාත් මට්ටමින් ගුරු පුස්තකාලයාධිපතිවරුන්, ගුරුවරුන් සහ පාසල් පරිපාලකයින් පුහුණු කිරීම සඳහා මෙම ගැටලු නිලීස් විසින් විසඳීමේ තොරතුරු සාක්ෂරතා ආකෘතිය බහුලව භාවිතා කරනු ලැබේ. තවද, නිලීස් පාඨමාලාවල සිසුන්ට ඉගැන්වීමේ/ඉගෙනීමේ ක්‍රියාවලියේදී ශිෂ්‍ය කේන්ද්‍රීය සම්පත් පාදක ඉගෙනුමක් ලබා දීම සඳහා නවතම ඉගැන්වීම් ඉගෙනුම් ශිල්පීය ක්‍රම භාවිතා කරයි. නිලීස් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන බලධාරීන්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමඟ සහයෝගයෙන් පුහුණු වැඩසටහන් ද පවත්වයි.
නිලීස් වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය නිලීස් කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට සහ අනෙකුත් වෘත්තිකයන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කිරීමට උපකාර වන සහ දිරිමත් කරන තවත් වැදගත් වාර්ෂික උත්සවයකි.

01.3 සංවිධාන ව්‍යුහය

නිලීස් කළමනාකරණ මණ්ඩලයේ එකඟතාව ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද ආයතනයේ අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක, අධ්‍යයන සහ මූල්‍ය නිලධාරියා වේ. ඔහු/ඇය කළමනාකරණ මණ්ඩලයේ සහ අධ්‍යයන කමිටුවේ හිටපු නිල සාමාජිකයෙකි.
කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ආචාර්ය ප්‍රදීපා විජේතුංග, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිලීස් හි අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. (2021 අප්‍රේල් 01)

ආයතනයේ සංවිධාන සටහන පහත දැක්වේ.



රූපය. 01. කොළඹ විශ්ව විද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයෙහි (නිලීස්) සංවිධාන

01.3.1 නිලීස් කළමනාකරණ මණ්ඩලය:

කළමනාකරණ මණ්ඩලය යනු ආයතනයේ අධ්‍යයන සහ විධායක ආයතනයයි. වත්මන් කළමනාකරණ මණ්ඩලය **පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ (අවශ්‍ය අවස්ථාවලදී ලබා දී ඇති කාල සීමාවන්).**

වගුව 1, නිලීස් කළමනාකරණ මණ්ඩලය

නම	තනතුර
මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා	සභාපති/ නිලීස්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සාමාජික, සභාපති/ පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (SCOLIS/ UGC) (නිල බලයෙන්)
ආචාර්ය ප්‍රදීපා විජේතුංග මහත්මිය	අධ්‍යක්ෂ / නිලීස් (නිල බලයෙන්)
ආචාර්ය එල්.එම්.කපිල බණ්ඩාර මහතා	පීඨාධිපති / අධ්‍යාපන පීඨය(නිල බලයෙන්)
මහාචාර්ය කේ.පී හේවාගමගේ මහතා	අධ්‍යක්ෂ(2022 ජුනි දක්වා)/ /කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත (SCOLIS/ UGC)
ආර්.සී.කොඩිකාර මිය	පුස්තකාලයාධිපති/මොරටුව විශ්වවිද්‍යාලය, පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත (SCOLIS/ UGC) (2021 පෙබරවාරි දක්වා)
ආචාර්ය සී.සී. ජයසුන්දර මහතා	පුස්තකාලයාධිපති/කැලණිය විශ්වවිද්‍යාලය, පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත (SCOLIS/ UGC) (2021 අප්‍රේල් සිට)
ආචාර්ය ඩබ්.ජේ.ජෙයරාජ් මහතා	පුස්තකාලයාධිපති/නැගෙනහිර විශ්වවිද්‍යාලය, පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත (SCOLIS/ UGC) (2021 අප්‍රේල් සිට)
ආචාර්ය ආර්.ඩී. ආනන්ද තිස්ස මහතා	සභාපති/ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (2021 නොවැම්බර් සිට) (නිල බලයෙන්)
ආචාර්ය නයනා විජේසුන්දර මිය	පුස්තකාලයාධිපති/ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත
ආචාර්ය චිත්‍රක වික්‍රමාරච්චි මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය / සංඛ්‍යානවිද්‍යා දෙපාර්තමේන්තුව / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත
ඩබ්.සුනිල් මහතා	අධ්‍යක්ෂ ජනරාල්/ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (නිල බලයෙන්)
එච්.ඩී.සී.ජානකී මිය	අධ්‍යක්ෂ/ ශිෂ්‍ය ණය අංශය/ අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත (නිල බලයෙන්)
ඩී.ටී. සුතර්ෂණ් මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් , ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය / භාණ්ඩාගාර නියෝජිත. (2022 පෙබරවාරි දක්වා)
කේ.කේ.එස්.එල්.පී.ගුණවර්ධන මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ /සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව/මුදල් අමාත්‍යාංශයල භාණ්ඩාගාර නියෝජිත (2022 මාර්තු සිට)
ගීතානී කන්නන්ගර මිය.	නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත. (නිල බලයෙන්)

01.3.2 නිලීස් අධ්‍යයන කමිටුව:

නිලීස් හි අධ්‍යයන කමිටුව අධ්‍යාපනය, විභාග සහ පර්යේෂණ සම්බන්ධ කාරණා පිළිබඳ ආයතනය පාලනය කරයි. අදාල වර්ෂය තුළ, පහත සඳහන් සාමාජිකයින් අධ්‍යයන කමිටුවෙ හි සේවය කරමින් සිටියහ (අවශ්‍ය අවස්ථාවලදී ලබා දී ඇති කාල සීමාවන්).

වගුව 2, නිලීස් *අධ්‍යයන කමිටුව*

නම	තනතුර
ආචාර්ය ප්‍රදීපා විජේතුංග මහත්මිය	අධ්‍යක්ෂ / නිලීස්
මහාචාර්ය එම්.කේ වීරසිංහ මහතා	අංශ ප්‍රධාන / පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය (2021 ඔක්තෝබර් සිට) (නිල බලයෙන්)
ඩබ්.සුනිල් මහතා	අධ්‍යක්ෂ ජනරාල්/ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (NLDSB) (නිල බලයෙන්)
ආචාර්ය නයනා විජේසුන්දර මහත්මිය	කළමනාකරණ මණ්ඩල නියෝජිත (BOM)
ජී.පී සෙනෙවිරත්න මහතා	කළමනාකරණ මණ්ඩල නියෝජිත (BOM)
ආචාර්ය සී.සී ජයසුන්දර මහතා	කළමනාකරණ මණ්ඩල නියෝජිත (BOM)
ආර්.සී.කොඩිකාර මිය	පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (SCOLIS/ UGC) නියෝජිත
ආචාර්ය ජී.ආර්. පද්මසිරි මහතා	පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (SCOLIS/ UGC) නියෝජිත
එම්.පී.පී දිල්හානී මිය.	ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නියෝජිත (SLLA)
ආචාර්ය ප්‍රසන්න රණවීර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (නිලීස්)
ආචාර්ය රුවන් ගමගේ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (නිලීස්) (2022 අගෝස්තු මස සිට සප්ත වාර්ෂික නිවාඩු ලබා ඇත)
උදිත අලහකෝන් මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (නිලීස්)

01.3.3 විගණන කමිටුව:

වගුව 3, නිලීස් *විගණන කමිටුව*

නම	තනතුර	
ආචාර්ය කපිල බණ්ඩාර මහතා	සභාපති	කළමනාකරණ මණ්ඩල නියෝජිත/ පීඨාධිපති අධ්‍යාපන පීඨය
ඩී.ටී. සුතර්ෂණ් මිය	සාමාජික	නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් , ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය / භාණ්ඩාගාර නියෝජිත. (2022 පෙබරවාරි දක්වා
කේ.කේ.එස්.එල්.පී.ගුණවර්ධන මිය	සාමාජික	නියෝජ්‍ය අධ්‍යක්ෂ / මුදල් අමාත්‍යාංශයල භාණ්ඩාගාර නියෝජිත (2022 මාර්තු සිට)
එච්.ඩී.සී ජානකී මිය	සාමාජික	අධ්‍යක්ෂ/ ශිෂ්‍ය ණය අංශය , අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත (නිල බලයෙන්)
අයි.ඩී.අයි ප්‍රියදර්ශනී මිය	සාමාජික	විගණක අධිකාරි, ජාතික විගණන කාර්යාලය
කේ.ඊ.ඩබ්. ජයසිරි මහතා	ලේකම්	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය ප්‍රදීපා විජේතුංග මහත්මිය	ආරාධිත	අධ්‍යක්ෂ/ නිලීස්
එච්.වී.එස්.එම්.ජයසේකර මිය		ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / නිලීස් (2022 මැයි දක්වා)
ඩී.ජී.සී.එන් බණ්ඩාර මහතා		වැ.බ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / නිලීස් (2022 ජුනි සිට)
ජේ.පී.විපුලරත්න මහතා		ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / නිලීස්

01.3.4 මූල්‍ය කමිටුව:

වගුව 4, නිලීස් *මූල්‍ය කමිටුව*

නම	තනතුර	
ආචාර්ය ප්‍රදීපා විජේතුංග මහත්මිය	සභාපති	අධ්‍යක්ෂ/නිලීස්
ආචාර්ය සී.සී ජයසුන්දර මහතා	සාමාජික	කළමනාකරණ මණ්ඩල නියෝජිත (BOM)
ඩී.ටී. සුතර්ෂණ් මිය	සාමාජික	නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් , ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය / භාණ්ඩාගාර නියෝජිත. (2022 පෙබරවාරි දක්වා
කේ.කේ.එස්.එල්.සී.ගුණවර්ධන මිය	සාමාජික	නියෝජ්‍ය අධ්‍යක්ෂ / මුදල් අමාත්‍යාංශය භාණ්ඩාගාර නියෝජිත (2022 මාර්තු සිට)
එච්.වී.එස්.එම්.ජයසේකර මිය	සාමාජික	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / නිලීස් (2022 මැයි දක්වා)
ඩී.ජී.සී.එන් බණ්ඩාර මහතා	සාමාජික	වැ.බ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / නිලීස් (2022 ජුනි සිට)
ජේ.පී.විපුලරත්න මහතා	සාමාජික	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / නිලීස්

01.3.5 රැස්වීම්වල ව්‍යවස්ථාපිත අවශ්‍යතා

වගුව 5, පවත්වන ලද රැස්වීම් සහ රැස්වීම්වල ව්‍යවස්ථාපිත අවශ්‍යතා.

රැස්වීම	*ව්‍යවස්ථාපිත අවශ්‍යතාව*	*පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව*
කළමනාකරණ කමිටු	08	08
ශාස්ත්‍රීය කමිටු	10	10
විගණන කමිටු	04	04
මූල්‍ය කමිටු	04	04

01.3.6 කාර්ය මණ්ඩලය

වගුව 06. NILIS කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිබඳ දළ විශ්ලේෂණය

අනු අංකය	තනතුර	සේවාව	ශ්‍රේණිය	වැටුප් කේතය	ක.සේ. දෙ අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම							
01	**අධ්‍යක්ෂ**	Academic		U-AC 5	01	1	-
02	**කථිකාචාර්ය (පරිවාස)/ කථිකාචාර්ය/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**	Academic		U-AC 3	03	2	1
03	**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**	UA&FS	II/I	U-EX 2	01	1	-
04	**ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී**	UA&FS	II/I	U-EX 2	01	1	-
05	**සහකාර පුස්තකාලයාධිපති**	Academic		U-AC 3	01	1	-
ද්විතියික මට්ටම							
06	**කළමනාකරණ සහකාර**	UMAS	III/II/I	U-MN 1	05	4	1
07	**කළමනාකරණ සහකාර (පොත් තබන්නා)**	UMAS	III/II/I	U-MN 1	01	1	-
08	**පුස්තකාල තොරතුරු සහකාර**	UMAS	III/II/I	U-MN 1	02	2	**** එක් පුස්තකාල සේවකයෙකු විසින් එක් පුස්තකාල තොරතුරු සහකාර පුරප්පාඩුවක් පුරවනලදී**
ප්‍රාථමික මට්ටම							
09	රියදුරු	UDS	III/II/I/Spl.	U-PL 3	01	1	-
එකතුව					**16**	**14**	**2**

01.3.7 බාහිර කථිකාචාර්ය මණ්ඩලය

නිලීස් හි ස්ථිර කථිකාචාර්යවරුන් දෙදෙනෙකු පමණක් සිටින බැවින්, එය බාහිර කථිකාචාර්යවරුන් හතළිස් දෙනෙකුගේ (40) පමණ සේවය ලබා ගනී.

02. 2022 තුළ පවත්වන ලද පාඨමාලා පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක්

මෙය පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සහ පාඨමාලාව පිරිනැමීමට සෘජුවම නියැලී සිටින කාර්ය මණ්ඩලයයි.

වගුව 7, පවත්වනු ලබන පාඨමාලා, බඳවා ගත් සිසුන් සංඛ්‍යාව සහ එක් එක් පාඨමාලාවට අනුයුක්ත කාර්ය මණ්ඩලය.

පාඨමාලාව	වර්ෂය සඳහා ලියාපදිංචි සිසුන්	සම්පූර්ණ සිසුන් සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩලය		අනධ්‍යයන කාර්ය මණ්ඩලය
			ස්ථිර	බාහිර	
දර්ශනපති/දර්ශනශූරි	2	6		1	1
ගුරු පුස්තකාලයාධිපතිත්වය	0	17	1	8	1
ගුරු පුස්තකාලයාධිපතිත්වය (MTL) පිරිවෙන්	0	10	1	7	1
පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip (LIS) පුස්තකාලය සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MLS) දක්වා	0	12	1	25	1
පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGLIS)	15	30	1	18	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - II (HDLIM - II)	33	58	1	9	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව II (Uva Province)	0	20	1	9	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව I (HDLIM I) (සිංහල මාධ්‍යය)	0	15	1	8	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව I (HDLIM I) (දෙමළ මාධ්‍යය)	0	23	0	8	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව I (HDLIM I) (ඌව පළාත)	0	26	1	8	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 1 (මධ්‍යම පළාත)	0	64	1	7	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - Part I (HDLIM - I)	0	34	1	8	1
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (DLIM)	25	95	1	9	1
මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DPL)	0	20	0	3	1
පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DSL) වයඹ පළාත	0	41	-	4	1
පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DSL) (දෙමළ මාධ්‍යය) ඌව පළාත	0	38	-	6	1
පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DSL) (සිංහල මාධ්‍යය) ඌව පළාත	0	44	-	8	1
පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DSL) (දෙමළ මාධ්‍යය)	0	48	-	6	1
පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DSL)	50	285	1	4	1
පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACL)	36	48	2	8	1
අධ්‍යාපනවේදී උපාධිය (Bed) III වසර (LIS මොඩියුලය)	106	106			
එකතුව	**267**	**1042**			

(මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, NILIS)

2022 වර්ෂය තුළ NILIS අධ්‍යාපන වැඩසටහන් 07ක් සඳහා සිසුන් 267ක් ලියාපදිංචි කර ඇති අතර සිසුන් 1042ක් සඳහා අධ්‍යාපන වැඩසටහන් 21ක් අඛණ්ඩව පවත්වා ගොස් ඇත. මෙම වැඩසටහන් සියල්ල අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලදී.

2022 වර්ෂය තුළ සිසුන් 264 දෙනෙකු සඳහා වැඩසටහන් 07කට අදාළ විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කරන ලදී. 264 න් 159 ක් (60.2%) සමත් විය.

02.1 2018-2022 කාලය තුළ බඳවා ගත් සිසුන් සංඛ්‍යාව


සටහන: 2022 දී බඳවා ගන්නා ලද මුළු සිසුන් සංඛ්‍යාව අධ්‍යාපන පීඨයට සෘජුවම ඇතුළත් වන අධ්‍යාපන උපාධි අපේක්ෂකයින් 106 ක් බැහැර කරයි.

රූප සටහන 2, 2018-2022 කාලය තුළ පශ්චාත් උපාධි, ඩිප්ලෝමාව/උසස් ඩිප්ලෝමාව, සහ සහතික පත්‍ර/උසස් සහතික පත්‍ර පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව පිළිබඳ දළ විශ්ලේෂණයක්.
(මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, NILIS)

02.2 පාඨමාලාවල ප්‍රගතිය (2018-2022)

02.2.1 පශ්චාත් උපාධි පාඨමාලා


කෙටි යෙදුම	පුළුල් කළ නම
MPhil/PhD	දර්ශනපති/ දර්ශනසූරී
MLS	පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති
MIM	තොරතුරු කළමනාකරණ ශාස්ත්‍රපති
MTL	ගුරු පුස්තකාලයාධිපතිත්ව ශාස්ත්‍රපති
PGLIS	පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - අර්ධකාලීන



රූපය 1. 2018-2022 තුළ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව
(මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, නිලීස්)

මූල්‍ය අර්බුදය හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය MTL වැඩසටහන සඳහා අරමුදල් නොසැපයූ නිසා, පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීම් සංඛ්‍යාව අඩු වී හෝ නොපැමිණ තිබේ. එය QAC/UGC හි අනුමත වීමට නියමිත බැවින්, එය ප්‍රචාරණය නොකළ නිසා MLS වෙත යන PGLIS පාඨමාලාවට සිසුන් බඳවාගෙන නොමැත.


02.2.2 ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලා



රූප සටහන 2, 2018-2022 කාලය තුළ ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව (මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, නිලීස්)

කෙටි යෙදුම	පුළුල් කළ නම
DSL	පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමාව
DPL	මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමාව
DLIM	පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
HDLIM I	පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව I
HDLIM II	පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව II


02.2.3 සහතික/උසස් සහතික පාඨමාලා



කෙටි යෙදුම	පුළුල් කළ නම
ACL	පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
ACPL	මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
ACSL	පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව


රූප සටහන 3,2018-2022 කාලය තුළ සහතික/උසස් සහතික පත්‍ර පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව (මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, නිලීස්)

02.2.3 2022 තුළ NILIS විසින් පවත්වනු ලබන පාඨමාලා වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ව්‍යාප්තිය



රූප සටහන 4, නිලීස් විසින් පිරිනමනු ලබන සියලුම පාඨමාලා වල ස්ත්‍රී පුරුෂ සමාජභාවී ව්‍යාප්තිය (මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, නිලීස්)

නිලීස් විසින් පිරිනමනු ලබන පාඨමාලා වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ශිෂ්‍ය ව්‍යාප්තිය පිළිබඳ සමාලෝචනයකින් හෙළි වන්නේ ශිෂ්‍යයන්ගෙන් 75% කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් බවයි.



රූප සටහන 5, පාඨමාලා අනුව ස්ත්‍රී පුරුෂ භාවය ව්‍යාප්තිය (මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, නිලීස්)

02.2.4 කෙටි කාලීන පාඨමාලා/ වැඩමුළු/ වෙබ් සම්මන්ත්‍රණ

නිලීස් සාමාන්‍යයෙන් පුස්තකාලවල සහ අනෙකුත් අංශවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා කෙටි පාඨමාලා පවත්වයි. එසේම, නිලීස් හවුල්කාර සංවිධානවල පාඨමාලා සහ වැඩමුළු පැවැත්වීමේ පරිශ්‍රය බවට පත්ව ඇත.

කෙසේ වෙතත්, රටේ පවතින වසංගත තත්ත්වය, ආර්ථික අර්බුදය සහ විදුලි අර්බුදය හේතුවෙන් නිලීස් හට කෙටි පාඨමාලා සහ වැඩමුළු පැවැත්වීමට නොහැකි විය. නමුත් නිලීස් විසින් 2022 වසරේ කියවීමේ මාසය සනිටුහන් කිරීමට සිංහල භාෂාවෙන් වෙබ් සම්මන්ත්‍රණ එකක් පවත්වන ලදී.

වගුව 8, 2022 තුළ පවත්වන ලද වෙබ් සම්මන්ත්‍රණ.

දිනය	සම්මන්ත්‍රණයේ නම	සම්පත් දායකයා
2022.10.23	තිරසාර ආර්ථික සංවර්ධනය සඳහා දේශීය දැනුම (සිංහලෙන්)	මහින්ද කුමාර දළුපොත මහතා

(මූලාශ්‍රය: අභ්‍යන්තර වාර්තා, 2022, නිලීස්)


02.3 පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවය

ශාස්ත්‍රපති උපාධිධාරීන් 18 (18) දෙනෙකු 2022 පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවය සඳහා සුදුසුකම් ලබා ඇත, නමුත් කොවිඩ් 19, ආර්ථික අර්බුදය සහ රට තුළ සංචාරක සීමාවන් හේතුවෙන් උපාධි ප්‍රදානෝත්සවය කල් දැමූ අතර එය 2023 දී පැවැත්වීමට නියමිතය.

02.4 ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය

2022 වසරේ සහතික පත්‍රලාභීන් දහසයක් (16) සහ ඩිප්ලෝමාධාරීන් එකසිය පනස් හය (156) දෙනෙක් සුදුසුකම් ලැබුවද 2022 වසරේ රට තුළ ඇති වූ අර්බුදය හේතුවෙන් ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය කල් දැමීමට සිදු වූ අතර එය 2023 දී පැවැත්වීමට නියමිතය.

02.5 නිලීස් පර්යේෂණ සම්මන්ත්‍රණය 2022



වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2022 වර්ෂයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ (නිලීස්) ප්‍රමුඛතම ඉසව්වකි. මෙහි තේමාව වුයේ "පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ අභියෝග ජය ගැනීමට නවෝත්පාදක ප්‍රවේශයන්" යන්නය. මෙය විශ්වවිද්‍යාල පර්යේෂණ සම්මන්ත්‍රණයේ තේමාව වූ "උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභියෝග ජය ගැනීම සඳහා ඩිජිටල් පරිණාමනය සහ නවෝත්පාදන ප්‍රවේශයන්" යන්නට අනුකූල වූවකි. ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයට පූර්ණ වශයෙන් කැප වූ ප්‍රථම පර්යේෂණ සම්මන්ත්‍රණය මෙය වන බැවින් 2022 මෙම සම්මන්ත්‍රණය සුවිශේෂීත්වයක් අත්කර ගනී. මෙය ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යන්තර සන්දර්භය තුළ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ සමකාලීන ගැටලු සහ අවධාරණයන් පිළිබඳ කාලීන කතිකාවතක් ගොඩ නංවා ගැනීමේ අවස්ථාවක් උදා කරන බව නිලීස් හි දැඩි විශ්වාසයයි. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ ඉන්දියානු පුස්තකාල හා විඥාපන විද්‍යා ගුරුවරුන්ගේ සංගමය මෙම සම්මන්ත්‍රණයේ හවුල්කරුවෝ වූහ.



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය.
එච්.ඩී. කරුණාරත්න
උප කුලපති,
කොළඹ
විශ්වවිද්‍යාලය

මෙම පර්යේෂණ සම්මන්ත්‍රණය සමාරම්භක සැසියකින්, ආරාධිත පර්යේෂණ පත්‍රිකා සැසියකින් සහ තාක්ෂණික සැසි තුනකින් සමන්විත විය. සමාරම්භක සැසිය කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී.කරුණාරත්න, නිලීස් කළමණාකරණ මණ්ඩලයේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා යන විද්වතුන්ගේ ආමන්ත්‍රණයන්ගෙන් ද පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් දෙදෙනෙකුගේ දේශනවලින්ද වර්ණවත් විය.රුසියාවේ සංස්කෘතිය පිළිබඳ සාන්ත පීටර්ස්බර්ග් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශයේ නියෝජ්‍ය පීඨාධිපති සහ අන්තර්ජාතික පුස්තකාල සංගම් සම්මේලනයේ අධ්‍යාපන සහ පුහුණු අංශයේ සභාපති මහාචාර්ය අලබීනා ක්‍රිම්ස්කායා සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ සිමෝන්ස් සරසවියේ පුස්තකාල සහ විඥාපන විද්‍යා පාසලේ දර්ශනසූරී පාඨමාලාවේ සම අධ්‍යක්ෂ සහ ඇමරිකා එක්සත් ජනපදයේ පුස්තකාල හ විඥාපන විද්‍යා අධ්‍යාපනය සඳහා වන සංගමයේ (ALISE) සභාපති මහාචාර්ය රොං ටැං යන මහත්මීන් මෙම පුමුඛ දේශන පැවැත්වූවෝ වූහ. කොවිඩ් 19 වසංගතය මගින් බල කෙරුණු සමාජ දුරස්ථභාවය හේතු කොට ගෙන පුස්තකාල සේවාවන් , විශේෂයෙන් මාර්ගගත සේවාවන් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් සඳහා අතිශයින් වැදගත් බවට පත් වූ බව උපකුලපතිතුමා මෙන්ම සභාපතිතුමා ද අවධාරණය කරන ලදී සීඝ්‍රයෙන් වෙනස් වූ මෙවන් අධ්‍යාපනික සුසමාදර්ශ තුළ දුරස්ථ පරිශීලකයන් සඳහා සේවා සැපයීමේ දී බොහෝ අභියෝගවලට මුහුණදීමට පුස්තකාලයාධිපතීන්ට සිදුවිය. මෙම නවතම පරිසරය තුළ පුස්තකාලයාධිපතීන්ට අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීමේදී පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය ද අභියෝග රැසකට මුහුණ දිණි. මෙම අභියෝග පිළිබඳ සාකච්ඡා කිරීමටත් එම අභියෝග ජය ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග හෝ එම ක්‍රියාමාර්ග අනුගත කිරීමට සැලසුම් සැකසීමටත් මෙම පර්යේෂණ සම්මන්ත්‍රණය අගනා අවස්ථාවක් පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනඥයන්ට සපයනු ඇති බව මහාචාර්යවරුන් දෙදෙනාගේම අදහස විය.



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
ප්‍රේමකුමාර ද සිල්වා,
සභාපති,
කළමනාකරණ
මණ්ඩලය / නිලීස්

පළමු ප්‍රධාන කථිකයා වූ මහාචාර්ය ක්‍රිමිස්කායා පෙන්වා දෙන ලද්දේ සිසුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීමට ජාත්‍යන්තර සහ දේශීය වෘත්තීයවේදී සංගම් සහ වෙනත් ආයතන සිසු සම්මන්ත්‍රණ (නැතහොත් පර්යේෂණ සම්මන්ත්‍රණවල සිසුන් සඳහා සැසි) වසන්ත පාසල්, කඳවුරු, ජාලකරණ වැඩසටහන්,පුස්තකාල සංගම්වල ශිෂ්‍ය සාමාජිකත්වය , සම්මන්ත්‍රණවල ස්වේච්ඡා කටයුතු, අතථ්‍ය ඉසව් සිසුන් වෙනුවෙන් සපයනු ලබන බවයි. කෙසේ වෙතත්, විභව කථිකයන් ලෙස කටයුතු කිරීමේදී මූල්‍යමය දුෂ්කරතා හෝ ශාස්ත්‍රීය අවශ්‍යතා හේතුකොටගෙන පුස්තකාල හා විඥාපන විද්‍යා සිසුන්ට මෙවන් අවස්ථා හැමවිටම නොපවතී.



මහාචාර්ය ඇල්බිනා ක්‍රිමිස්කායා

කොවිඩ්-19 වසංගත සමයේ විවිධ විෂය පරාසයන් ආවරණය වන පරිදි විවිධ zoom සැසි රැසක් පැවැත්විය ද පුස්තකාල හා විඥාපන විද්‍යා සිසුන් මෙම ඉසව්වලින් පිටත සිටී බව පෙනේ. පුස්තකාල හා විඥාපන විද්‍යා සිසුන්ට අදාළ එවන් කිසිදු වැඩසටහනක් නොපැවැත්විණි. IFLA/SET මෙම පරතරය වටහා ගෙන යම් මුලපිරීමකට අවතීර්ණ වූ බව ඇය පෙන්වා දිණි. මෙය Covid 19 නිසා ඔවුන්ට අහිමි වූ අන්තර්ක්‍රියාකාරී අවස්ථා වෙනුවෙන් IFLA ප්‍රජාව සමඟ සංවාදයන්ට සහභාගි වීමට අතථ්‍ය වෙබ් සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කෙරිණි. එමෙන්ම මෙවන් අතථ්‍ය සහ නොමිලේ පවත්වන ලද වැඩසටහන් නිසා සිසුන්ට තම මෘදු කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලැබුණු බවද ඇය අවධාරණය කළාය. මෙම ව්‍යාපෘතිය අනෙක් රටවලට ද ව්‍යාප්ත කළ හැකි බව ඇය වැඩිදුරටත් පැවසීය.

දෙවන ප්‍රධාන කථිකයා වූ මහාචාර්ය රොං ටැන් පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ වෙනත් පර්යාලෝකයන් අවධාරණය කරන ලද අතර නිපුණතා පාදක අධ්‍යාපනය සහ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයට එහි ඇති සබඳතාව පොදුවේත් දත්ත සේවා පුහුණුවට ඇති සබඳතාව විශේෂයෙනුත් ගෙනහැර දැක්වීය. නිපුණතා පාදක අධ්‍යාපනය නවෝත්පාදක අධ්‍යාපනික සුසමාදර්ශයක් බව ඇය අවධාරණය කළාය. ඉගෙනුම සඳහා ඉහළ නම්‍යශීලීත්වයක් මෙන්ම පුද්ගලයන්ට ආවේනික මාවතක් සමඟ ඔවුන් දක්නා දේ සහ කළ හැකි දේ මත පදනම්ව ඉදිරියට යාමට හැකියාව සැපයීම මගින් ඉගෙනුම්කරුවන්ගේ සමානත්වය ප්‍රවර්ධනය කරන අතර ඔවුන් සවිබල ගන්වයි. පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තීය ක්ෂේත්‍රය තුළ බහුවිධ සංවිධාන නිපුණතා රාමු සංවර්ධනය කර ඇති බව ඇය ප්‍රකාශ කළාය. එමෙන්ම ශාස්ත්‍රීය ප්‍රකාශන ගණනාවක් නිපුණතා පාදක අධ්‍යාපනය මත පදනම් වූ පුස්තකාල හා විඥාපන විද්‍යා ව්‍යවහාර වාර්තා කර ඇත. පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තිකයන් පුහුණු කිරීම අවශ්‍ය බවත් පර්යේෂණ දත්ත සේවා ඵලදායිව ඉදිරිපත් කිරීමට හැකියාවන් යළි අත්පත් කරගත යුතු බවත් මහාචාර්ය ටැන් පෙන්වා දුනි. මෙම සන්දර්භය තුළ පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තීයවේදී සංවිධාන විසින් ස්ථාපිත කළ දත්ත නිපුණතා රාමු සහ දත්ත කුසලතා මාතෘකාව පිළිබඳ ප්‍රකාශිත පර්යේෂණ මහාචාර්ය ටැං විසින් ඉදිරිපත් කරන ලදී. අනතුරුව ඇය නිපුණතා පාදක අධ්‍යාපනය මත පදනම් වූ පුහුණු වැඩසටහන් දෙකක් පිළිබඳ උදාහරණ දක්වන ලද අතර මෙම පරතරයන් පියවීමටත් සාර්ථක දත්ත සේවා සැපයීමට පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තිකයන් සූදානම් කිරීමටත් උපායමාර්ග ඉදිරිපත් කළාය.



මහාචාර්ය රොං ටැන්

<u>ආරාධිත පර්යේෂණ පත්‍රිකා සැසිය</u>



මහාචාර්ය ඩෙනිස් ඔවොල්ලා

ආරාධිත පර්යේෂණ පත්‍රිකා සැසිය පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥයන් හත්දෙනෙකුගේ(07) පත්‍රිකාවලින් සමන්විත විය. මෙම සැසිය ආරම්භ කරමින් දකුණු අප්‍රිකාවේ සුලුලන්ත විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඩෙනිස් ඔවොල්ලාය. ඔහු කොවිඩ්-19 වසංගත කාලය තුළ අප්‍රිකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපන අත්දැකීම් සහ පර්යාලෝකයන් ගෙනහැර දැක්වීය.ඔහු අවධාරණය කරන ලද්දේ දකුණු අප්‍රිකාව පුරා පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපඥයන් පර්යේෂණ, ඉගැන්වීම් සහ ඉගෙනුම ඇතුළු බහුවිධ පර්යාලෝකයන් වෙතින් අත්දැකීම් ලද බවය. මූලික වශයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වෙත ප්‍රවේශය හා භාවිතය, නවෝත්පාදනය, පරිණාමනය, ස්වයං ඉගෙනුම, මිශ්‍රිත ඉගෙනුම සහ නම්‍යශීලීත්වය මෙම අත්දැකීම් අතර ශක්තිමත් ලෙස මතු වූ බවද ඔහු පැවසීය. වසංගත කාලයේ දී පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය මුහුණ දුන් අභියෝග බොහෝමයක් පිළිවෙළින් දේශපාලනික, ආර්ථික, සමාජීය හා තාක්ෂණික ඒවා විය. අවස්ථාවන්ගේ සහ තාක්ෂණික සාධකවල සමීපත්වය වඩාත් ශක්තිමත්ව විද්‍යාමාන විය. එය අනාගතයේදී පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය සඳහා ‘නව සාමාන්‍ය’ තත්ත්වය යනුවෙන් නිර්වචනය කළ හැකි බව අපි විශ්වාස කරමු.



මහාචාර්ය ජග්තාර් සිං

ඉන්දියාවේ ගුරු කාෂි විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන සහ IATLIS හි සහයෝගිතා සහ හවුල්කාරිත්ව අධ්‍යාපන මහාචාර්ය ජග්තාර් සිං දකුණු ආසියානු රටවලට අදාළ සමුද්දේශයන් සමඟ ඉන්දියාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ තත්ත්වය වෙත අවධානය යොමු කළේය. පීඨය, සිසුන්, පාඨමාලා, සම්පත් යටිතල පහසුකම්වලට අදාළ ගැටලු, පෞද්ගලික ආයතන බොහෝමයක උපරිව්‍යුහ අවධාරණයන්, විවෘත සහ දුරස්ථ ඉගෙනුම් වැඩසටහන් මෙම තත්ත්වය තුළ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ ගුණාත්මක බව, පර්යේෂණය දුර්වලම සම්බන්ධකය වීම, න්‍යාය හා භාවිතය අතර පරතරයක් පැවතීම, සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රම ආධිපත්‍ය දැරීම යනාදිය වෙත ඔහුගේ විශේෂ අවධානය යොමු විය. ඉගෙනුම්කරුවන් අතර උසස් මට්ටමේ කුසලතා ප්‍රවර්ධනයට සහ රැකියාමය කුසලතා සමඟ පුස්තකාල හා විඥාපන විද්‍යා වැඩසටහන් සාරවත් කිරීමට ෆිල්ජ් පංතිකාමර, ව්‍යාපෘති පාදක සහ සම්පත් පාදක ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමක අවශ්‍යතාව මහාචාර්ය සිං අවධාරණය කළේය.



මහාචාර්ය එම්.නසිරුද්දීන් මුන්ෂි

බංගලාදේශයේ ඩකා විශ්වවිද්‍යාලයේ තොරතුරු විද්‍යා සහ පුස්තකාල කළමනාකරණ අධ්‍යයනාංශයේ මහාචාර්ය එම්.නසිරුද්දීන් මුන්ෂි පෙන්වා දෙන ලද්දේ වර්තමානයේ රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල හතරක් තොරතුරු විද්‍යා සහ පුස්තකාල කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය පිරිනමන බවත් රාජ්‍ය විද්‍යාල තුනක් සහ පෞද්ගලික විශ්වවිද්‍යාල ගණනාවක් ඇතුළු ආයතන 50ක් පමණ පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිරිනමන බවත් මෙම වැඩසටහන්වලින් සෑම වසරකම පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තීයවේදීන් තුන් දහසක් පමණ බිහි කරන බවත්ය. මහාචාර්ය මුන්ෂි බංගලාදේශයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනයේ සංවර්ධනයට පවතින බාධක සාකච්ඡා කරන ලද අතර මෙම ගැටලු විසඳීම සඳහා නිර්දේශ කීපයක්ද යෝජනා කළේය.



මහාචාර්ය වාඕ ඩෙං වෙං

වං යූ ආන් ක්‍රිස්තියානි සරසවියේ සහ තායිවානයේ සාමාන්‍ය ජාතික විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු අධ්‍යයන උසස් උපාධි ආයතනයේ පුස්තකාලයාධිපති මහාචාර්ය වාඕ ඩෙං වෙං විසින් තායිවානයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංපන තත්ත්වය සහ අනාගත ප්‍රවණතා ඉදිරිපත් කරන ලදී. තායිවානයේ පුස්තකාල තොරතුරු පාසල් හතක් පවත්නා බවත් ඒවායේ උපාධි පාඨමාලා තුනක් ද ශාස්ත්‍රපති පාඨමාලා හතක්ද දර්ශනශූරී පාඨමාලා තුනක්ද පවත්නා බවත් මහාචාර්ය වෙං සඳහන් කළාය. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පරිණාමය වේගවත් වී ඇති බවත් විෂයාන්තර සහයෝගීතාව සහ සංවර්ධනය තායිවානයේ බෙහෙවින් වැදගත් අංශයක් වී ඇති බවත් ඇය වැඩිදුරටත් පැවසීය. ඒ අනුව පුස්තකාල හා විඥාපන විද්‍යාඥයෝ අධ්‍යාපනයේ දී පරිගණක විද්‍යාව, තොරතුරු ඉංජිනේරු විද්‍යාව, ඉගෙනුම් විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදනය යන විෂයන් සමඟ කටයුතු කරති.මෙම සහයෝගිතාවේ ප්‍රතිඵලයක් ලෙස අධ්‍යයනාංශය පුස්තකාල හා තොරතුරු විද්‍යා පසුබිම මෙන්ම තොරතුරු ඉංජිනේරු විද්‍යා පසුබිම සහිත වශයෙන් පුද්ගල විවිධත්වයකින් සමන්විත වේ. ඩිජිටල් තාක්ෂණයේ ශීඝ්‍ර වෙනස්වීම් පැවතියද පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ සුවිශේෂීත්වය එලෙසම පවත්නා බවත් තොරතුරු පිරිසැකසීම සහ මානව සේවා මෙම ක්ෂේත්‍රයේ හරය තුළ අඛණ්ඩව පවතින බවත් මහාචාර්ය වෙන් අවධාරණය කළාය.



මහාචාර්ය කුල්තිදා කොමිසුක්

තායිලන්තයේ චොං කයෙන් විශ්වවිද්‍යාලයේ තොරතුරු විද්‍යා අධ්‍යනාංශයේ සහ සුහුරු ඉගෙනුම් නවෝත්පාදක පර්යේෂණ මධ්‍යස්ථානයේ මහාචාර්ය කුල්තිදා කොමිසුක් පැහැදිලි කරන ලද්දේ වර්තමානයේ පවත්නා ප්‍රවෝකථනය කළ නොහැකි තාක්ෂණය තායිලන්තයේ උසස් අධ්‍යාපනයේ කළමනාකරණය වෙත ප්‍රබල බලපෑමක් එල්ල කර ඇති බව ය. මෙයට අභ්‍යන්තරික මෙන්ම බාහිර පාරිසරික වෙනස් වීම හේතු වී ඇත. රාජ්‍ය සහ පෞද්ගලික අංශවල රැකියාවන්හි පවතින වෙනස්වීම්, කර්මාන්ත ක්ෂේත්‍රයේ නව බඳවාගැනීම්වලට තවදුරටත් උපාධි සහතික නොව සේවා නිපුණතාව සලකා බැලීම නිසා උසස් අධ්‍යාපන පිළිබඳ ආකල්ප වෙනස් වී තිබීම, වයස අවුරුදු 18- 22 ජනගහනයට දැනුම අත්පත් කර ගැනීමටත් ඩිජිටල් ලෝකය තුළ තමන් සංවර්ධනය කර ගැනීමටත් අපමණ මාර්ග පැවතීම, මාර්ගගත ව්‍යාපාර මගින් හෝ ප්‍රධාන ප්‍රවාහයේ උසස් අධ්‍යාපන වැඩසටහන් මත රඳා පැවැත්මකින් තොරව ස්වාධීන රැකියා සකසා ගැනීම මගින් ආදායම් උපදවා ගැනීමේ වැඩි අවස්ථා පැවතීම මෙයට නිදසුනක් වේ. මෙම බලපෑම් පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය ද ඇතුළුව තායිලන්තයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ උපදේශාත්මක මෙහෙයුම් බොහෝ සෙයින් පරිණාමනය වීමට හේතු වී ඇත. නව වර්ධක යාන්ත්‍රණය (NGC) කර්මාන්ත ක්ෂේත්‍රයේ ශ්‍රම බල අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට ජාතික මට්ටමෙන් ගත් මූලපිරීමක් විය. මෙම NGE ව්‍යාපෘතියට අනුව අධ්‍යයනාංශයේ සියලු අධ්‍යයන පාඨමාලා සුහුරු අධ්‍යාපන සංකල්පය භාවිතා කිරීම මගින් සම්පූර්ණ වශයෙන්ම ප්‍රතිශෝධනය හා සැලසුම් කර ඇත. ඉල්ලුම වෙතට යොමු වූ නිපුණතා පාදක ඉගෙනුම් ඵල, මොඩියුල පාදක අන්තර්ගතය, සක්‍රීය ඉගෙනුම සහ කාර්ය වෙත සමෝධානිත ඉගෙනුම ඊට ඇතුලත් වේ.



මහාචාර්ය ඔසනෝරි කොයිසුමි

ජපානයේ ත්සුකුබා විශ්වවිද්‍යාලයේ පුස්තකාල, තොරතුරු සහ මාධ්‍ය විද්‍යාපීඨ සහකාර මහාචාර්ය ඔසනෝරි කොයිසුමි, ත්සුකුබා සරසවියේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් ඉදිරිපත් කළේය. 21 සියවසෙහි වයස්ගත ජනතාවක් සහිත සමාජයක් වීම හේතු කොට ගෙන ජපානයේ විශ්වවිද්‍යාල දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටින බව ඔහු පෙන්වා දුනි. වයස 18 මට්ටමේ ජනගහනය විශ්වවිද්‍යාලවල සිසුයෙන් පහළ යාම ජපානය විශ්වවිද්‍යාලවලට බලපා ඇති බරපතළ ගැටලුවකි. මෙය දේශීය සහ ගෝලීය වශයෙන් සිසුන් ආකර්ෂණය කර ගැනීමට නව පාඨමාලා නිර්මාණය කිරීමට ජපාන විශ්වවිද්‍යාලවලට බල කර ඇත. ත්සුකුබා විශ්වවිද්‍යාලයේ අන්තර්ජාල පාසල පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ විශාලතම ආයතනය වේ. එය ජපානය තුළ වඩාත්ම දියුණු හා පරිපූර්ණ පාඨමාලා, සිසුන්ට සපයනු ලබයි. මෙම අන්තර්ජාල පාසල තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති සහ දර්ශනශූරී වැනි නවතම උපාධි පාඨමාලා නිර්මාණය කර තිබේ. මෙය 2020 විශ්වවිද්‍යාලවල උපාධි පාසල් ප්‍රතිසංවිධානයෙන් පසුව සිදු කෙරිනි. පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපන වැඩසටහන්වල වෙනස්කම් සාකච්ඡා කරන අතර පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ අභිප්‍රාය පුළුල් කිරීමේ අවශ්‍යතාව යෝජනා කරයි. එහිදී 21 වන සියවසේ සන්දර්භය තුළ පුස්තකාල හා තොරතුරු විද්‍යා රැකියා ප්‍රවර්ගයන්හි නියත වර්ග වෙත ද ඔහුගේ අවධානය යොමු කෙරිණි.



අධ්‍යක්ෂ ආචාර්ය ප්‍රදීපා විජයතුංග

කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ප්‍රදීපා විජයතුංග ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විවිධ ගැටලු අවධාරණය කරමින් පැහැදිලි කිරීමක් කළාය. ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා අධ්‍යාපන පද්ධතියේ කිසිදු ජාතික සම්බන්ධීකරණයක් නොපැවතීම, ස්ත්‍රී පුරුෂ භාවය, ආදායම, ප්‍රාදේශීයත්වය සහ සංස්කෘතික සමානාත්මතාවය සම්බන්ධයෙන් බරපතළ අසමතුලිතතා පැවතීම, උපාධි පාඨමාලාවලදී හැර පුස්තකාල විද්‍යා විෂය සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතන සම්බන්ධයෙන් තත්ත්ව සහතිකයක හෝ පිළිගැනීමේ ක්‍රියාපටිපාටි නොපැවතීම මේ අතරින් ප්‍රමුඛ වේ. ශක්තිමත් විෂයමාලා සංවර්ධන කණ්ඩායම් ගොඩ නැංවීමේ අවශ්‍යතාව, පුස්තකාල හා තොරතුරු විද්‍යා හර විෂය මාලාවක් නොමැතිවීම, වර්තමාන රැකියා අවශ්‍යතාවලට පුස්තකාල හා තොරතුරු විද්‍යා පාඨමාලාවල අදාළත්වය අඩුවීම, පුස්තකාල හා තොරතුරු විද්‍යා විෂය ඉගැන්වීමට පූර්ණ කාලීන ගුරුවරුන් නොමැති වීම යන කරුණු ද ඇය වැඩිදුරටත් අවධාරණය කළාය. Covid 19 වසංගතය පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනය සඳහා අවස්ථා මෙන්ම අභියෝග රැසක් සපයා ඇති බව ප්‍රකාශ කළ ඇය හඳුනාගත් ගැටලු ආමන්ත්‍රණය කිරීමට මූලපිරීම් කිහිපයක් ද යෝජනා කළාය.

මහාචාර්ය ඩබ්ලිව්. එම්. කේ. වීරසිංහ සහ ආචාර්ය රුවන් ගමගේ විසින් මෙහෙයවන ලද විද්වත් සාකච්ඡා වාරයකින් පසු මෙම සැසිය අවසන් විය. ඒ සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ සියල්ලෝම සහභාගි වූහ. බොහෝ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනඥයන් තාක්ෂණය සහ පුස්තකාල හා තොරතුරු විද්‍යාවේ නිපුණතා පාදක ආදර්ශ වෙතට දැනටමත් යොමුව හෝ යොමු වීමට සැලසුම් කර ඇති බවත් පුස්තකාල හා තොරතුරු විද්‍යා සිසුන්ගේ දැනුම හා කුසලතා අතිරේකනය කිරීමට පුස්තකාල හා තොරතුරු විද්‍යා නොවන ශිෂ්‍යයන් සමඟ සහයෝගීත්වය ඇති කරගැනීමට බොහෝ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපඥයන් පියවර ගෙන ඇති බවත් මෙහිදී හඳුනා ගැණිනි. වසංගතය නිසා යොමු වූ මාර්ගගත ඉගැන්වීම් / ඉගෙනුම් පරිසරය සහ වෙනත් හඳුනාගත් සාධක විසින් මතු කළ අභියෝග ජය ගැනීමට විශේෂයෙන් පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනය යොමු විය යුතු අනාගත දිශානතිය මෙය බවට සැවොම එකගත්වය පළ කළහ.


ආරාධිත පර්යේෂණ පත්‍රිකා සැසියෙන් පසු පළමු තාක්ෂණික සැසිය පවත්වන ලද අතර ඊට පත්‍රිකා හතක් ඉදිරිපත් කෙරිණි. පංජාබ් විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානී මහාචාර්ය එච්.පී. කල්රා ඉන්දියාවේ පුස්තකාල හා තොරතුරු විද්‍යා මාර්ගගත අධ්‍යාපනයට පවත්වන ප්‍රධාන බාධාව ඩිජිටල් බෙදුම බව සාකච්ඡා කළේය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සපයන ලද පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනයේ සංවර්ධනයට ශ්‍රී ලංකාවේ දායකත්වය ආචාර්ය රුවන් ගමගේ සහ ආචාර්ය ඒ. රියාස් අවධාරණය කළහ. ආචාර්ය ජී. ආර්. පද්මසිරි ශ්‍රී ලංකාවේ දර්ශනසූරී උපාධි හදාරන සිසුන් මුහුණ දෙන අභියෝග සහ ගැටලු පැහැදිලි කළේය. පී. රමනන් මාර්ගගත වැඩසටහන් පිළිබඳ NILIS දෙමළ මාධ්‍ය සිසුන්ගේ සංජානනය ඉදිරිපත් කරන ලද අතර උදිත අලහකෝන් 2004-2020 දක්වා NILIS හි ගුරු පුස්තකාලයාධිපතීත්ව ශාස්ත්‍රපති පාඨමාලාව (MTL) හදාරන ලද සිසුන්ගේ තෝරාගත් පර්යේෂණ නිබන්ධ මාතෘකා පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කළේය.


ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ආචාර්ය ආර්.ඩී. ආනන්ද තිස්ස ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනයේ පරිණාමය පැහැදිලි කළ්ය. ආචාර්ය එම්.එම්. මශ්රූෆා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සපයන ලද පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනයේ නව ප්‍රවණතා සාකච්ඡාවට බඳුන් කළාය. මාලදිවයිනේ පුස්තකාල හා


ඉන් අනතුරුව සමාන්තර තාක්ෂණික සැසි දෙකක් පවත්වන ලද අතර ඊට NILIS වෙතින් පශ්චාත් උපාධි ලැබූ සිසුන්ගේ පර්යේෂණ පත්‍රිකා 12ක් ඇතුළත් විය. මෙම පත්‍රිකාවන්හි මාතෘකා පුළුල් පරාසයකින් යුක්ත විය. ශ්‍රී ලාංකීය ශාස්ත්‍රඥයන්ගේ සමාජ මාධ්‍ය භාවිතය, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල සේවා සපයන්නා සහ සේවාලාභියා අතර නිරීක්ෂිත ගුණාත්මක පරතරය, ආසියා-පැසිපික් කලාපයේ විශ්වවිද්‍යාල පුස්තකාල විසින් තිරසර සංවර්ධන ඉලක්ක(SDS) සපුරා ගැනීම, ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂක පුස්තකාල පාඨකයන්ගේ ඩිජිටල් තාක්ෂණ කුසලතා ඇගයීමට නිශ්චිත සැලැස්මක් සංවර්ධනය කිරීම. වළාකුළු තාක්ෂණය වෙතට පුස්තකාල කළමනාකරණ පද්ධති උසස් කිරීම, ශ්‍රී ලංකාවේ ලලිත කලා සම්බන්ධිත උසස් අධ්‍යාපන ආයතනවල ආයතනික තැන්පතුවලට නිර්මාණාත්මක කලා කෘති ඇතුළත් කිරීම, ශ්‍රී ලංකාවේ පුස්තකාලවල වැඩ අවකාශ ස්ථාපිත කිරීමේ විභවය, භූ අවකාශීය දත්ත කළමනාකරණයේදී ශාස්ත්‍රීය පුස්තකාල සහභාගිත්වය, කලා සහ සංස්කෘතිය හරහා ආර්ථිකය සවිබල ගැන්වීම වෙතට මහජන පුස්තකාල විසින් ක්‍රියාත්මක කරන ප්‍රජා වැඩසටහන්, ශාස්ත්‍රීය පුස්තකාලවල කෘත්‍රිම බුද්ධිය ව්‍යවහාර කිරීම, ශ්‍රී ලංකාවේ පාසල්වල පවත්වනු ලබන තොරතුරු සාක්ෂරතා වැඩසටහන්වල තත්ත්වය සහ පුස්තකාල සඳහා අතථ්‍ය චාරිකා නිර්මාණය කිරීම මෙම මාතෘකා වේ.

ස්වකීය විෂයමාලා සහ සැපයුම් මාදිලි යළි සලකා බැලීමට පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනඥයන් දිරිමත් කළ උසස් මට්ටමේ අදාළත්වයක් සහ කාලීනත්වයෙන් මෙම පර්යේෂණ සම්මන්ත්‍රණය සමන්විත වූ බව සහාගිවූවන්ගේ අදහස විය. එමෙන්ම වඩාත් පරිපූර්ණ සහ නාභිගත වූ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනික වැඩසටහන් සැපයීමට පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනඥයන් වෙනත් ශික්ෂණයන්හි අධ්‍යාපනඥයන් සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවද පිළිගැණිනි.













රූප සටහන 5, සම්මන්ත්‍රණයේ උද්දීපනය කරන ලද අවස්ථා වල තිර රුවක්

03. පර්යේෂණ සහ සංවර්ධනය සඳහා නිලීස් හි දායකත්වය

03.1 පර්යේෂණ සහ සංවර්ධනය සඳහා නිලීස් හි දායකත්වය

03.1.1 පර්යේෂණ ආධාර

ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපති සංගමය (IASL) විසින් නිලීස්, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ සහ ඉන්දියාවේ ගුජරාටයේ මධ්‍යම විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා පාසලේ පර්යේෂකයන් පිරිසකට US $500 ප්‍රදානය කරන ලදී. ප්‍රදානලාභීන්ගේ ලැයිස්තුව: ආචාර්ය රශ්මි කුම්බාර්, සහකාර මහාචාර්ය, පුස්තකාල හා තොරතුරු විද්‍යා පාසල, ඉන්දියාවේ ගුජරාට් මධ්‍යම විශ්වවිද්‍යාලය; ආචාර්ය ප්‍රදීපා විජේතුංග, අධ්‍යක්ෂ - නිලීස්, කොළඹ විශ්වවිද්‍යාලය; ඉන්දියාවේ ගුජරාටයේ මධ්‍යම විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා පාසලේ ආචාර්ය උපාධි ශිෂ්‍ය සගෙන්දර් සිං පර්මාර් මහතා; ආචාර්ය රුවන් ගමගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, නිලීස්, කොළඹ විශ්වවිද්‍යාලය; කොළඹ විශ්වවිද්‍යාලයේ නිලීස් හි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති උදිත අලහකෝන් මහතා.

03.1.2 බාහිර ආයතනවල කටයුතු සඳහා නිලීස් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය

❖ ආචාර්ය ප්‍රදීපා විජේතුංග / අධ්‍යක්ෂක

- කළමණාකරණ මණ්ඩල සාමාජික/ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය / කොළඹ විශ්වවිද්‍යාලය
- කළමණාකරණ මණ්ඩල සාමාජික/ විශ්වවිද්‍යාල මුද්‍රණාලය/ කොළඹ විශ්වවිද්‍යාලය
- පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටු සාමාජික/වි.වි.ප්‍ර.කොා.ස
- සනාතන සභා සාමාජික/ කොළඹ විශ්වවිද්‍යාලය
- නිවාඩු සහ සම්මාන කමිටුවේ සාමාජික/ කොළඹ විශ්වවිද්‍යාලය
- අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ කමිටුවේ සාමාජික / කොළඹ විශ්වවිද්‍යාලය
- පීඨාධිපති සහ අධ්‍යක්ෂ කමිටුවේ සාමාජික/ කොළඹ විශ්වවිද්‍යාලය
- පුස්තකාල කමිටුවේ සාමාජික/ කොළඹ විශ්වවිද්‍යාලය

❖ ආචාර්ය රුවන් ගමගේ **/** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

- ජාතික පුස්තකාල පර්යේෂණ අංශයේ උපදේශක කමිටු සාමාජික
විශේෂ සේවා - කවුන්සිල් හා කමිටු	194,215	304,267
විශේෂ සේවා - විත්තිමය	20,000	-
අධ්‍යයන පර්යේෂණ	400,000	550,000
විගණන ගාස්තු	87,430	4,670
වරෙන්තු සහ චාර ටිකට් පත්	85,745	91,922
සංග්‍රහ ව්‍යදම්	20,198	21,340
වෙනත්	4,000	80,000
සේවක සංවර්ධන	3,000	17,888
දායකත්ව සහ සාමාජික ගාස්තු	1,181,150	484,800
විභාග ව්‍යදම්	2,400,588	3,577,196
සංවර්ධන අරමුදලට දායකත්වය	5,271,826	5,770,583
එකතුව		
	7,362,848	7,774,983
මුළු එකතුව		

සටහන් 19	2022	2021
මූල්‍ය පිරිවැය		නැවත ප්‍රකාශිත
		(රු.)
	200	52,700
බැංකු ගාස්තු	186,815	203,632
දේපළ ණය පොළි	187,015	256,332
එකතුව		

1. මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය **(NILIS)**

1.1 වාර්තා කිරීමේ භාවය

ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය 1999 අංක 1 දරන ආඥාපනත සහ 1999 අප්‍රේල් 19 වැනි දින ගැසට් පත්‍රය යටතේ සංස්ථාපිත කර ඇත. එය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයකි. ආයතනයේ මූල්‍ය කාලසීමාව 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා වේ. 2021 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා සකස් කරන ලද ආයතනයේ මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි බලය ලබා දී 2022 පෙබරවාරි 28 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 24 වැනි දින කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කිරීමට අවසර දෙන ලදී.

1.2 මූල්‍ය කාල සීමාව

ආයතනයේ මූල්‍ය කාලය 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස දොළහක් නියෝජනය කරයි

2. සකස් කිරීමේ පදනම සහ අනෙකුත් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 සකස් කිරීමේ පදනම

ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනයේ මූල්‍ය ප්‍රකාශය වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් මිස ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇත.

2.2 සංසන්දනාත්මක තොරතුරු

සම්මත කරන ලද සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ වන අතර, චත්මන් වර්ෂයේ සංඛ්‍යා ඉදිරිපත් කිරීමේ වෙනස්කම්වලට අනුකූල වන පරිදි අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා සකස් කර ඇත.

2.3 අනුකූලතා ප්‍රකාශය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

2.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

NILIS හි කළමනාකාරිත්වය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

2.5 යන කනස්සල්ල

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, ආයතනයට ඉදිරියට යාමට ඇති හැකියාව කළමනාකරණය විසින් තක්සේරු කර ඇත. බල කළ හැකි අනාගතය සඳහා මෙහෙයුම් පැවැත්ම සඳහා NILIS සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකාරිත්වය සාධාරණ අපේක්ෂාවක් දරයි. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින්, ඇවර කිරීමේ හෝ මෙහෙයුම් නතර කිරීමේ අවශ්‍යතාවයක් NILIS අපේක්ෂා නොකරයි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී NILIS අඛණ්ඩව සැලකිලිමත් වීමේ පදනම අනුගමනය කරයි.

2.6 වාර්තා කළ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන, වාර්තා කළ දිනට පසුව ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් නොතිබුණි.

2.7 හිලව් කිරීම

SLPSAS විසින් අවශ්‍ය හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් සහ වගකීම්, සහ ආදායම් සහ වියදම් පියවා නැත.

2.8 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන 'ශ්‍රී ලංකා රුපියල්වලින්' (රු.) ඉදිරිපත් කර ඇති අතර සියලු අගයන් ආසන්නතම රුපියල් අගයට වට කර ඇත.

2021 විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අවසාන ශේෂයන් 2022 මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂයන් ලෙස ගන්නා ලදී.

2.9 වැටයිම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණය ආසන්නතම රුපියලට වටයා ඇත.

2.10 සැලකිය යුතු ගිණුම් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් මූල්‍ය වර්ෂය අවසානයේදී ආදායම්, වියදම්, වත්කම්, බැරකම් ප්‍රමාණයන්ට බලපෑ හැකි විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදන විට, අනාගත ඇස්තමේන්තු හා අනෙකුත් අංශවලට අදාළව සිදු කරන ලද ප්‍රධාන උපකල්පන සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිමිහානය යටතේ සාකච්ඡා කෙරේ.

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1 දේපල කම්හල සහ උපකරණ

ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ, පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර, සවිකෘත සහ උපාංග, පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන සහ මෝටර් වාහන, රජයේ ප්‍රදාන, අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් සහ පරිත්‍යාග වලින් ලබාගත් අයිතම ඇතුළත් වේ.

දේපල කම්හල සහ උපකරණ අඩු සමුච්චිත ක්ෂයවීම් පිරිවැය/ප්‍රති තක්සේරු කළ මුදලින් වාර්තා වේ.

3.1.1 මෝටර් රථ

ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනයට අයත් මෝටර් වැන් රථය 2016.01.01 දිනට ගෙනයාමේ අගය බිංදුව පැවති අතර, තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් 2016 වර්ෂයේදී රු.4,800,000/- කට නැවත තක්සේරු කරන ලදී. නැවත තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස

වත්කම් රැගෙන යාමේ ප්‍රමාණය රුපියල් 4,800,000/- කින් වැඩි කර ඇති අතර, අතිරික්තය නැවත තක්සේරු කිරීමේ සංචිතයට බැර කර ඇත.

ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය සතු රුපියල් 7,390,000/- ක් වටිනා මෝටර් රථය මහා භාණ්ඩාගාරයෙන් ප්‍රදානයක් ලෙස ලැබී තිබුණි.

3.1.2 ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ

2018.01.01 දිනට ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ සහ පරිගණක සහ මුද්‍රණ යන්ත්‍රවල සමස්ත පන්තියම තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් නැවත තක්සේරු කර ඇත.

2018.01.01 දින සිදු කරන ලද නැවත ඇගයීමේ ප්‍රතිඵලයක් ලෙස, සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් ඇතුළුව ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණවල වටිනාකම් රුපියල් 8,127,457/-ක් නැවත තක්සේරු කර ඇති අතර, 2018.01.01 දිනට එහි රැගෙන යා හැකි වටිනාකම් රුපියල් 617,586/- ක් විය. . නැවත ඇගයීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රති තක්සේරු කිරීමේ අතිරික්තය රුපියල් 2,417,199/- ක් ප්‍රති තක්සේරු සංචිතයට බැර කර තිබූ අතර ප්‍රති තක්සේරු කිරීමේ හිඟය රු.180,135කි.

3.1.3 පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර

2018.01.01 දින, සම්පූර්ණ ක්ෂය වූ වත්කම් ඇතුළුව රුපියල් 4,751,539/- ක් වටිනා පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර නැවත තක්සේරු කර ඇති අතර, නැවත තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එහි රැගෙන යා හැකි වටිනාකම් රු. - නැවත තක්සේරු කිරීමේ සංචිතයට බැර කර තිබුණි.

3.1.4 වාහනය -HB 9627

මෙම වාහනය මුලින් කොළඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී යටතේ ලියාපදිංචි කර ඇති අතර 2014 දී ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනයේ නමට මාරු කරන ලදී.

3.1.5 NILIS ගොඩනැගිල්ල

ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනයේ ගොඩනැගිල්ල GEP II ව්‍යාපෘතිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ඉඩමක ඉදිකරන ලදී. ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය විසින් අල්ලාගෙන සිටින ගොඩනැගිල්ලේ කොටසක් නඩත්තු කිරීම ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය මගින් සිදු කෙරේ.

ගොඩනැගිලි නඩත්තු කිරීම යටතේ පුනරුත්ථාපනය කිරීම සහ ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම පුනරාවර්තන වියදම් ලෙස සලකනු ලැබේ.

2013 වසර දක්වා ප්‍රාග්ධනීකරණය වූ ඉඩම් සහ ගොඩනැගිලි 2014 වසරේ ආදායම් වියදම් ලෙස හඳුනාගෙන 2014 වර්ෂයේදී අදාළ ගිණුම් ගැලපීම් සිදු කරන ලදී.

3.1.6 සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්

2021.12.31 දිනට සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල පිරිවැය රු.13,439,774/- වූ අතර එයින් පොත් සහ චාර සඟරා රු.8,148,045/- නියෝජනය කරයි. පොත් සහ චාර සඟරා හැර සම්පූර්ණ ක්ෂය වූ වත්කම් සෑම වසර පහකටම වරක් නැවත තක්සේරු කෙරේ.

පහත හේතූන් මත පොත් සහ චාර සඟරා නැවත ඇගයීම ප්‍රායෝගිකව අපහසු වේ.

¬ පොත් සහ චාර සඟරා නැවත ඇගයීම සඳහා විශේෂිත දැනුමක් ඇති විශේෂඥයෙකු සොයා ගැනීම අපහසුය

¬ වර්තමාන වෙළෙඳපොළ මිල අනුව පොත් සඳහා වටිනාකමක් තැබීම අපහසුය

¬ පොත් ප්‍රමාණය ඉතා ඉහළය

¬ එය කාලය ගතවන ක්‍රියාවලියක් වන අතර ඊට සම්බන්ධ පිරිවැය ඉහළය.

3.1.7 ක්ෂය වීම

සියලුම දේපල කම්හල සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් භාවිතය සඳහා ලබා දී ඇති දින සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත.

ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ

ගෘහ භාණ්ඩ සහ උපකරණ 12.5%-20%

මෝටර් වාහන 10%

පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර 20%-100%

සවිකෘත සහ සවි කිරීම් 20%

පුස්තකාල පොත් සහ චාර 20%

3.4 කොටස්

3.4.1 නැවත තක්සේරු කිරීමේ සංචිතය

2016 වසරේ සමුච්චිත අතිරික්තයන්/හිඟයන් යටතේ ඇතුළත් කර ඇති රුපියල් 4,800,000/- ක නැවත තක්සේරු කිරීමේ සංචිත ශේෂය 2017 වසරේ සිට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වෙන වෙනම අනාවරණය කර ඇත.

2021 දෙසැම්බර් 31 දිනට ඇති ප්‍රති තක්සේරුකරණ සංචිතයට 2016 වසරේ ප්‍රති තක්සේරු කරන ලද මෝටර් වාහනයේ ප්‍රති තක්සේරුකරණ අතිරික්තයට අමතරව 2018 වසරේ සිදු කරන ලද වන්කම් ප්‍රති තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පැන නැගි ඇති ප්‍රති තක්සේරුකරණ අතිරික්තය/හිඟය ඇතුළත් වේ.

3.4.2.1 සීමා කළ අරමුදල්

සීමා කරන ලද අරමුදල්වලට විශේෂිත අරමුණු සඳහා කැපවී සිටින ආයතනික සංවර්ධන අරමුදල සහ පරිත්‍යාග අරමුදල ඇතුළත් වේ. වාර්ෂික පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවයේදී රන් පදක්කමක් ප්‍රදානය කිරීමේ අරමුණින් 2016 සහ 2017 කාලය තුළ බාහිර පාර්ශ්වවලින් ලැබුණු දායක මුදල් පරිත්‍යාග අරමුදල නියෝජනය කරයි.

2017 කෙටි කාලීන වගකීම් යටතේ වර්ගීකරණය කරන ලද පරිත්‍යාග අරමුදලට ආරෝපණය කළ හැකි අරමුදල් 2018 දී සීමා කළ අරමුදල් යටතේ වර්ගීකරණය කර ඇත. ඒ අනුව සංසන්දනාත්මක සංඛ්‍යා නැවත දක්වා ඇත.

3.5 ආදායම සහ වියදම්

3.5.1 ආදායම් පිළිගැනීම්

ආදායම වසර තුළ ආයතනයට ලැබුණු සහ ලැබිය යුතු ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන්ගේ දළ ගලා ඒම සමන්විත වන අතර ශුද්ධ වත්කම්/කොටස්වල වැඩි වීමක් නියෝජනය කරයි. ආයතනය SLPSAS 10

(විනිමය ගනුදෙනු වලින් ආදායම) සහ SPSAS 11 (විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම) හි ස්ථාපිත නිර්ණායක අනුව ආදායම හඳුනා ගනී.

3.5.2 විනිමය ගනුදෙනුවෙන් ලැබෙන ආදායම්

(අ) ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම්

බාහිර වැඩසටහන් වලින් ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්, පිරිවැය ප්‍රතිසාධනය සහ ලාභ නොලබන පදනම් මත සිදු කෙරේ. ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වල උපකාරක ගාස්තුව, කාලසීමාව සඳහා කරන ලද වියදම්වල ප්‍රමාණය සහ අනාගත වියදම් සහ සංවර්ධන ඡන්ද සඳහා දායක වන ප්‍රමාණය අනුව මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ කල් දැමූ ආදායම් යටතේ දක්වා ඇත.

(ආ) ශිෂ්‍ය අයුම්පත් ගාස්තු සහ ලියාපදිංචි ගාස්තු මුදල් පදනම් මත පිළිගනු ලැබේ.

(ඇ) පොලී ආදායම

මෙම කාලසීමාව සඳහා ලැබුණු පොලී ආදායම, පරිත්‍යාග අරමුදලෙන් උපයාගත් ආයෝජන ආදායම හැර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විනිමය ආදායම ලෙස සටහන් වේ. එම අරමුදල්වලින් උපයන ආයෝජන ආදායම් වියදමට වඩා වැඩි වූ විට, එම අතිරික්තය අදාළ අරමුදලේ සෘජු වැඩිවීමක් ලෙස සටහන් වන අතර සමුච්චිත සංචිත සහ ප්‍රදාන යටතේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඇතුළත් වේ.

3.5.3 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම්.

විනිමය නොවන ගණුදෙණු යනු විනිමය වශයෙන් ආසන්න වශයෙන් සමාන වටිනාකමක් ලබා නොදී වෙනත් ආයතනයකින් (උදා: මුදල් හෝ වෙනත් වත්කම්) ආයතනයට වටිනාකමක් ලැබෙන අවස්ථා වේ. වත්කමක නිර්වචනය සපුරාලන සේවා වර්ග හැර වෙනත් හුවමාරු නොවන ගණුදෙණු වලින් ලැබෙන සම්පත් ගලා ඒම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ:

• ආයතනයට ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන් ගලා ඒමට ඉඩ ඇත; සහ

2.9.3 සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට නැවත වර්ගීකරණය

විශ්ව විද්‍යාලය SLPSAS 11 සම්මත කර අදාළ කර ඇත- විනිමය නොවන ගනුදෙනු ප්‍රතිඵලයෙන් ලැබෙන ආදායම 2022 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සමගාමී කිරීම සඳහා, SLPSAS 11 සහ නිකුත් කරන ලද මගපෙන්වීම් අනුව කොටස් වෙනස්වීම් ප්‍රකාශනයේ වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදානය, වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානය, තැගි සහ පරිත්‍යාග සම්බන්ධයෙන් සංසන්දනාත්මක සංඛ්‍යා "සමුච්චිත අනිරික්ත ප්‍රාග්ධනය" ලෙස නැවත වර්ග කර ඇත. APFASL.

3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය SLPSAS 2 ට අනුකූලව වක්‍ර ක්‍රමයට සකස් කර ඇති අතර එමඟින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත.

• හි සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැනිය හැක.

චත්කම් ලෙස පිළිගැනෙන විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන සම්පත් ගලා ඒම, එම ගලා ඒම සම්බන්ධයෙන් වගකීමක් හඳුනා නොගන්නා තරමට, විනිමය නොවන ආදායම් ලෙස පිළිගැනේ.

ආයතනයේ විනිමය නොවන ගනුදෙනු සම්බන්ධයෙන් නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායක පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රදාන/ ස්ථාන මාරු

රාජ්‍ය ප්‍රදාන මගින් උපයන චත්කම් සහ ආදායම්, පැවරුම් විධිවිධානය සාධාරණ වටිනාකමට බැඳී පවතින කාල සීමාව තුළ හඳුනා ගැනේ. මාරුවක් යටතේ වන නැන කොන්දේසි සහ විනිමය නොවන ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන වගකීමක් ඇති විට, කොන්දේසිය සම්පූර්ණ වන තෙක් ආයතනය වගකීමක් පිළිගත්තේය.

රජයේ ප්‍රදාන වලින් ලැබෙන චත්කම් සහ ආදායම් මනිනු ලබන්නේ පිළිගත් දිනට සාධාරණ වටිනාකමටය. මුදල් චත්කම් මනිනු ලබන්නේ ඒවායේ නාමික අගයෙනි.

(ආ) පුනරාවර්තන දිමනාව

පුනරාවර්තන ස්වභාවික වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන හුවමාරු නොවන සංක්‍රාන්ති යටතේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ පිළිගනු ලැබේ.

(ඇ) ප්‍රාග්ධන වාරණ ප්‍රදාන සහ වෙනත් මාරු කිරීම්

ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන සහ අනෙකුත් ප්‍රාග්ධන මාරු කිරීම් SLPSAS 11 හි අවශ්‍යතාවයට අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත, 2022 මුදල් වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම්. ප්‍රාග්ධන ගනුදෙනු සමුච්චිත අරමුදල යටතේ රැස් කර ඇත- මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } HED/F/I/NILIS/2022/FA/04 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 31 දින

NILIS RECEIVED 06 JUN 2023 ADMINISTRATION BRANCH

අධ්‍යක්ෂ,

ජාතික පුස්තකාල හා විඳාපන විද්‍යා ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඳාපන විද්‍යා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

SAB
SAR / NILIS
PI.
FNA
06/06/2023

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-
1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම් , මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/NILIS/2022/FA/04 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 31 දින

අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඉකුත් වර්ෂයේ රු.398,000 ක් වූ උපචිත වියදම් සඳහා අධි වෙන්කිරීම පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් ධාරණ අගය ශුනය වූ පිරිවැය රු.8,146,724 ක් වූ පුස්තකාල පොත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම පුස්තකාල පොත් තොගය 2020 වර්ෂයේ සිට සමීක්ෂණය කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී බැංකුවට ලැබී තිබුණු රු.776,850 ක් වූ සෘජු ප්‍රේෂණ වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) එක් විදුලි මීටරයකින් ආයතනය හා කොළඹ විශ්වවිද්‍යාලයේ එක් පීඨයක් විදුලිය ලබාගෙන තිබුණු අතර ආයතනයේ විදුලි පරිභෝජන කොටස ලෙස 2019 සිට 2022 වර්ෂය දක්වා එකතුව රු.3,703,858 ක් ගෙවන ලෙස කොළඹ විශ්වවිද්‍යාලය මාසිකව දැනුම් දී තිබුණ ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 22 ඡේදය ප්‍රකාරව විදුලි ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමක් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම් එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්ව ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මනය සඳහා පදනම් කොටසේ (ආ) සහ (ඇ) යටතේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

	නීතිරීති/ විධානයට යොමුව	**විස්තරය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 7 හා 8 වගන්ති හා 2007 ජූනි 12 දිනැති අංක 15/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	යොමුගත රෙගුලාසිවලට පටහැනිව 1996 ඔක්තෝබර් 14 දිනැති අංක 691 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් තිදෙනෙකු සඳහා රු.220,000 ක වාහන ණය ලබාදී තිබුණි.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හතර දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.28,789,031 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.
(ඇ)	1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබූ විභාග 03 ක ප්‍රතිඵල නිකුත් කිරීම දින 123 සිට දින 190 ක කාලයක් ප්‍රමාද වී තිබුණු අතර විභාග 07ක ප්‍රතිඵල 2023 පෙබරවාරි 28 දින වනවිටත් නිකුත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2009 අගෝස්තු 27 දින ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගුරු සේවා ව්‍යවස්ථාවට ගුරු පුස්තකාලයාධිපති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශාස්ත්‍රපති පාඨමාලාව හා ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළත් කළ යුතු වුවද අධ්‍යාපන අමාත්‍යාංශය ඊට අදාළ කටයුතු සිදුකර නොනිබීම හේතුවෙන් එම පාඨමාලා සඳහා ගුරුභවතුන් ඉල්ලුම් කර නොතිබුණි. එබැවින් උක්ත පාඨමාලා 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය අතර කාලය තුල අත්හිටුවා තිබුණි. ආයතනය පිහිටුවීමේ අරමුණු අනුව ඉලක්කගත ගුරු පුස්තලායාධිපතින් පාඨමාලා සඳහා ඉල්ලුම් නොකිරීම ආවරණය කරගැනීම සඳහා වෙනත් කණ්ඩායම් ඉලක්ක කරගනිමින් පුස්තකාල තොරතුරු අධ්‍යයන පාඨමාලා හා කෙටිකාලීන පාඨමාලා ක්‍රියාත්මක කිරීමට 2017 වර්ෂයේ සිට ආයතනය කටයුතු කර තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශිෂ්‍ය ආදායම තුළ වර්ෂ 01 ට වඩා වැඩි රු.2,685,280 ක ශේෂයක් පැවති අතර එම ශිෂ්‍ය ආදායම අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

08.විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

මගේ අංකය NILIS/35/2/22

2023.07.26

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල.

<u>කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.</u>

අප වෙත ලැබී ඇති එච්ඊඩී/එෆ්/එන්අයිඑල්අයිඑස්/2022 /එෆ් ඒ/04 දරන 2023 මැයි මස 31 දිනැති අවසන් වාර්තාවේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අප ආයතනයේ අදහස් හා පැහැදිලි කිරීම් පහත පරිදි වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම.

(අ) ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) 2023/2024 වසර තුලදී ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

(ඇ) මේ වනවිට එම මුදලින් රු.490,950.00 හදුනාගෙන ඇති අතර දැනට ඉතිරිව ඇත්තේ රු 285,900.00 ක ප්‍රමාණයකි. මෙම මුදලද හදුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

(ඈ) 2022 නොවැම්බර් 04 වන දින පැවති කළමණාකරන මණ්ඩලයේ 180 වන රැස්වීමේ දී ලබා දුන් උපදෙස් පරිදි 2022 නොවැම්බර් 22 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී, NILIS ආයතනයේ අධ්‍යක්ෂතුමිය, අධ්‍යාපන පීඨාධිපතිතුමා, NILIS ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරු සහ අධ්‍යාපන පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහභාගී වූ රැස්වීමෙදී අධ්‍යාපන පීඨයේ මුළු විදුලි බිලෙන් 33.33%ක් NILIS ආයතනයේ විදුලි බිල ලෙස ගෙවීමට එකඟතාවයකට පැමිණුනි.

අධ්‍යාපන පීඨයට සහ NILIS යන ආයතන දෙකටම ඇත්තේ එක විදුලි ගිණුමක් පමණක් බැවින් අධ්‍යාපන පීඨයට ලැබෙන මුළු විදුලි බිලෙන් 33.33%ක් කොළඹ විශ්වවිද්‍යාලය වෙත ගෙවිය හැකි බවට උපකුලපතිතුමා එකඟ විය. අධ්‍යාපන පීඨයේ පවතින ගොඩනැගිලි ගොඩනැගිලි තුන සඳහා වෙන වෙනම විදුලි මීටර තුනක් ලබා ගැනීමට කඩිනම් පියවර ගන්නා ලෙසට උපකුලපතිතුමා වැඩ ඉංජිනේරුවරයාට උපදෙස් දුන් අතර ඉන් එකක් NILIS ගොඩනැගිල්ල වේ.

ඒ අනුව අධ්‍යාපන පීඨයේ මුළු විදුලි බිලෙන් 33.33% ක් විදුලි පරිභෝජනයේ NILIS ප්‍රතිශතය ලෙස ගෙවීමට 2022.12. 30 වන දින පැවති කළමණාකරන මණ්ඩලයේ 181 වන රැස්වීමේදී අනුමත කරන ලදී. ඒ අනුව 2022 දෙසැම්බර් මස සිට මාසිකව විදුලි බිල ගෙවීම සිදුකරමින් පවතින අතර 2019 සිට හිඟව පවතින ප්‍රමාණයෙන් රු ලක්ෂ 10ක මුදලක් 2023 මැයි මාසයේදී ගෙවීමට කටයුතු කර ඇත. ඉතිරි හිඟ ප්‍රමාණය රජයේ ප්‍රතිපාදනයෙන් ඉල්ලුම් කිරීමට කටයුතු කරමින් සිටී.

2.2.2 නීති රීති/ විධානයට යොමුව.

(අ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ බැංකු ක්‍රමය අතර වාහන ණය ලබාදීම සඳහා විශේෂිත වූ ක්‍රමවේදයක් නොමැති අතර සියලුම විශ්වවිද්‍යාල 1996 ඔක්තෝම්බර් 14 දිනැති අංක 691 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය පදනම් කරගනිමින් වාහන ණය ලබාදීම සිදු කරනු ලබයි. තවද අංක 691 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය මේ වනතුරුත් අවලංගු කර නොමැති අතර අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රතිග්‍රහනය(adopt) කර නොමැත.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා, අංක UGC/CH/11 සහ 2023 මැයි 23 දින දරණ ලිපියෙන්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම පිළිබඳ පොදු ක්‍රමවේදයක් පිළිබඳව යෝජනා ඉදිරිපත් කරන ලෙස උප කුලපතිවරුන්ගේ කමිටුවට (CVCD) දන්වා ඇත. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන අතර එතෙක් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) 2022 වර්ෂය තුළ පැවැත්වූ විභාග වල ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

	පාඨමාලාව	විභාග පැවැත්වූ දින	**2022** වර්ෂයේ පැවැත්වූ විභාගවල ප්‍රතිඵල සම්බන්ධ කාරණය
1.	DSL 2021/2022 Tamil Medium	• 2022 ජුනි 12,19,26 • 2022 නොවැම්බර් 27.11 • 2022 දෙසැම්බර් 03,04	1. මෙම සෙමෙස්තර පරීක්ෂණ පවත්වන ලද්දේ මාර්ගගත ක්‍රමයටයි. මාර්ගගත පරීක්ෂණ පැවැත්වීමේ දී ලබා දී ඇති කාලය තුල සිසුන් විසින් උත්තර පත්‍ර scan කර WhatsApp මගින් ආයතනය වෙත එදිනම එවනු ලැබේ. ඉන්පසුව ඔවුන් ලියූ පිලිතුරු පත්‍ර ලියාපදිංචි තැපෑල මගින් ආයතනය වෙත එවනු ලැබේ. 50කට අධික පිලිතුරු පත්‍රවල මෘදු පිටපත් ඇගයීමට ඉතා අපහසු බැවින් එහි දෘඩ පිටපත ලබාදෙන ලෙස පිලිතුරු පත්‍ර පරීක්ෂකවරුන් ඉල්ලා සිටියි. 2022 දී තිබූ තෙල් අර්බුදය හේතු කොටගෙන ආයතනයේ සේවකයින් ඇතුලු බොහෝ දෙනා සේවය කරන ලද්දේ වැඩමුර ක්‍රමයටයි. මෙම ගැටලුව ඔක්තෝබර් මස වන තෙක් පැවතුනි.
2.	DLIM 2021/2022	• 2022ජුනි 12,19,26 • 2022 දෙසැම්බර් 17,24,31	
3.	HDLIM - 1 2021/2022 (Sinhala Medium)	• 2022 ඔක්තෝබර් 01,02,08	
4.	HDLIM - 1 2021/2022 (Tamil Medium)	• 2022 ඔක්තෝබර් 01,02,08	2. අප ආයතනයේ පිළිතුරු පත්‍ර පරීක්ෂකවරුන් බොහෝදෙනෙකු බාහිර කථිකාචාර්යවරුන් වන අතර ඔවුන් සිටින්නේද කොළඹින් බැහැරවයි. තවද මෙම පිලිතුරුපත් පරීක්ෂකවරුන් දෙදෙනෙකු ඇගයීම සිදුකරයි. එක් පරීක්ෂකවරයෙකු පිලිතුරුපත් ලකුණු කල පසු එම පිළිතුරුපත් ආයතනය වෙත ආපසු ගෙන්වා නැවත courier ක්‍රමය මගින් දෙවන පරීක්ෂකවරයා හට ඇගයීම සඳහා ලබාදෙනු ලැබේ. ඒ අනුව පිලිතුරු පත්‍ර ගොනු කර සකස් කිරීමට මසකට අධික කාලයක් ගතවේ. 3. තවද සිසුන්ගේ පැවරුම්ද ආයතනය මගින් අදාල කථිකාචාර්යවරයාට ලබාදෙනුයේද courier ක්‍රමය මගින් වන අතර ඒවාද ඇගයීම් කර එවීමට කාලය ගත වේ. මෙම ගැටලු නිරාකරණය කර ගනිමින් නිසිවේලාවට ප්‍රතිඵල නිකුත් කිරීමේ කටයුතු සිදුකිරීමට අප සියලු ප්‍රයත්නයන් දරනු ලැබේ. දැනට මෙම පාඨමාලාවල ප්‍රතිඵල ඉතා ඉක්මනින් නිකුත් කිරීමට නියමිතයි.
5.	HDLIM - II 2020/2021 (Western Province)	• 2022 ජුනි 11,18,19	2023.05.10 වන දින ප්‍රතිඵල නිකුත් කර ඇත.
6.	HDLIM - II 2020/2021 (UVA,Province)	2022 ජුනි 11,18,19	2023.06.12 වන දින ප්‍රතිඵල නිකුත් කර ඇත.
7.	DSL 2021/2022 Sinhala Medium	• 2022 ජුනි 12,19,26 • 2022 නොවැම්බර් 27,11 • 2022 දෙසැම්බර් 03,04	2023.07.04 වන දින ප්‍රතිඵල නිකුත් කර ඇත.

8.	HDLIM - 1 2020/2021 (UVA, Western and Central Province)	• 2022 ජනවාරි 29,30 • 2022 පෙබරවාරි 06 • 2022 ජූලි 10,17	2023.07.28 වන දින ප්‍රතිඵල නිකුත් කර ඇත.

2.2.3 1999 අප්‍රේල් 19 දිනැති අංක 1076/1 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ දැකවෙන 1999 අංක 1 දරණ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 4 (අ) සිට 4 (ඕ) දක්වා (ඇමුණුම 01) පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ අප ආයතනයට අයත් කාර්යභාරය පැහැදිලි වේ . නියමාවලියෙහි දැක්වෙන පරිදි ආයතනය මගින් පැවත්විය හැකි පාඨමාලා ගුරු පුස්තකාල විෂයට පමණක් සීමා නොවන අතර එමගින් ලබා දී ඇති බලතල අනුව දැනට උසස් සහතික පත්‍ර පාඨමාලාවේ සිට ආචාර්ය උපාධිය දක්වා පාඨමාලා 10ක් පමණ NILIS ආයතනය විසින් පවත්වනු ලැබේ .

පාසල් පුස්තකාල 4000ක් සංවර්ධනය කර එම පුස්තකාල සඳහා ගුරු පුස්තකාලයාධිපතිවරුන් 4000ක් බඳවා ගෙන ලෝක බැංකු ආධාර යටතේ 1998 දී ශ්‍රී ලංකාවේ දියත් කරන ලද සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියේ දෙවන සංරචකයට (GEP 2) අනුව ඔවුන් පුහුණුකිරීම වැඩිදුර උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා දීමට ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය පිහිටුවීම සිදුකළද ගුරු පුස්තකාලයාධිපතිවරුන්ගේ උසස්වීම්වලට අදාළ වන පරිදි ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම කිරීම සඳහා බලතල ඇත්තේ NILIS ආයතනයට නොව අධ්‍යාපන අමාත්‍යාංශයට සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටය.

ගුරු සේවා ව්‍යවස්ථාවේ මෙම වෙනස්කම් සිදු කිරීමට 2009 අගෝස්තු මස 27 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණ ද එම තීරණය මේ වන තෙක් ක්‍රියාත්මක වී නොමැත. 2012.08.16 දින සහ 2014.09.12 දින වල දී පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කමිටු (COPE) රැස්වීම්වලදී ද මේ පිළිබඳ සාකච්ඡා කර අදාළ ගැටලුව ඉක්මනින් විසඳන මෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට වරින් වර දැනුම් දී ඇත. එහෙත් මේ සම්බන්ධයෙන් මෙතෙක් සාධනීය පියවරක් ගෙන නොමැත

කෙසේ වෙතත්, ගුරු පුස්තකාලයාධිපති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ගුරු පුස්තකාලයාධිපති ශාස්ත්‍රපති පාඨමාලාව සහ ගුරු පුස්තකාලයාධිපති ඩිප්ලෝමාව යනුවෙන් පාඨමාලා පූර්ණකාලීනව සහ අර්ධකාලීනව හදාරන ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු ලබා දීම ද අධ්‍යාපන අමාත්‍යාංශයේ 2013.06.07 දින දරන 26/2013 චක්‍රලේඛය මගින් අනුමත කර තිබේ.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබියදී පවා එම කාර්ය ඉටු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු නොකර සිටීම කණගාටුවට කරුණකි. NILIS ආයතනය අදාළ පාඨමාලා පැවැත්වීම සඳහා සියලු උත්සාහයන් සහ ක්‍රියාමාර්ග ගෙන තිබුණ අතර මේ සම්බන්ධයෙන් දිගින් දිගටම අමාත්‍යතුමා සහ නිලධාරීන් සමග සාකච්ඡා පවත්වා ඇත. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයද මේ සම්බන්ධයෙන් දිගින් දිගටම අධ්‍යාපන අමාත්‍යාංශයට සිහි කැඳවීම් කර ඇත.
2018/2020 අධ්‍යයන වර්ෂයේ පාසල් පුස්තකාල කටයුතු භාරව කටයුතු කරන අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පිරිසක් ගුරු පුස්තකාලාධිපතිත්ව පශ්චාත් උපාධි පාඨමාලාව හදාරනු ලැබූ අතර ඔවුන්ගේ පාඨමාලා ගාස්තු ගෙවන ලද්දේ ද අධ්‍යාපන අමාත්‍යාංශය මගිනි. එසේම පිරිවෙන් පුස්තකාල කටයුතු භාරව කටයුතු කරන පිරිවෙන් අධ්‍යක්ෂ හිමිවරුන් 2019/2020 අධ්‍යයන වර්ෂයට ගුරු පුස්තකාලාධිපතිත්ව පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා බඳවා ගන්නා ලද අතර එම හිමිවරුන්ගේ පාඨමාලා ගාස්තු ගෙවන ලද්දේ ද අධ්‍යාපන අමාත්‍යාංශය මගිනි. එමෙන්ම ඔවුන්ගේ උසස්වීම් සඳහා මෙම පශ්චාත් උපාධිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පිළිගෙන තිබේ. ඒ හා සම්බන්ධ ලිපිය අමුණා ඇත.**(ඇමුණුම 02)** නමුත් 2021 වසරේ සිට ප්‍රතිපාදන නොමැති කමින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිසුන් යොමු කිරීම නතරවී ඇත.

ගුරු පුස්තකාලයාධිපතිවරුන්ගේ උසස්වීම්වලට අදාළ වන පරිදි ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කළයුතු කාර්යයක් වුවද මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් අදාල පාර්ශවයන් නැවත නැවත දැනුවත් කිරීම සහ සාකච්ඡා තුළින් ඒ සඳහා මැදිහත් වී කටයුතු කිරීමේ වගකීම අප අයතනය මගහැර නොමැති බවද අවධාරණය කිරීමට කැමැත්තෙමි.

2.2.4 පිළිගැනීමේ නිලධාරි තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැති වුවද ආයතනයට පිටතින් පැමිනෙන අමුත්තන් (පාඨමාලා සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට හා ආයතනය සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට), හා සිසුන් (නිබන්ධන හා පැවරුම් භාරදීමට, විභාග අයදුම්පත් භාරදීමට) විභාග අංශයට හා කාර්යාල පරිශ්‍රය තුලට පැමිණීම වැලැක්වීමේ අරමුණින්, සහ විභාග හා අනෙකුත් රාජකාරීවල රහස්‍යභාවය සුරක්ෂිත කිරීමත් සඳහා මෙම පිළිගැනීම් මේසය මිලදී ගැනීමට යෙදුනි. පිළිගැනීම් මේසය නිෂ්කාර්යව නොපවතින අතර ඉහත සඳහන් කළ සියළු කාර්යයන් දැනටත් සිදුකරනුයේ මෙම මේසය උපයෝගීකරගෙන බව දන්වනු කැමැත්තෙමි.

2.3 වෙනත් කරුණු.

වසර 1කට වඩා වැඩි කාලයක් ගතවූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු තුල නියෝජනය කරන්නේ පාඨමාලාවල පළමු වාරිකයට අදාල පාඨමාලා ගාස්තු ගෙවා ලියාපදිංචි වූ සිසුන් වන අතර ඔවුන් යම් හේතුවක් නිසා පාඨමාලා හැර ගිය සිසුන් වේ. ඔවුන්ගේ පාඨමාලා කාලය අවුරුදු 03 ඉක්මවූ පසු කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලේඛණ වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

ස්තුතියි.

ආචාර්ය ප්‍රදීපා විජේතුංග
අධ්‍යක්ෂ

පිටපත්: 1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය.
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
4. උප කුලපති, කොළඹ විශ්වවිද්‍යාලය